කාර්යසාධන වාර්තාව

2024

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ජය මාවත, කටුබැද්ද, මොරටුව.
දුරකථන අංකය : 011-2044860
ෆැක්ස් අංකය : 011-2044879
වෙබ් අඩවිය : http://www.csd.lk

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂය සඳහා වන ප්‍රගතිය පිළිබඳව කාර්ය සාධන වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

මෙම දෙපාර්තමේන්තුවේ වර්තමානයේ බලකා 26 කින් පුහුණු පාසල් 02 කින් සහ විශේෂ ව්‍යාපෘති 03කින් මුළු ශ්‍රී ලංකාද්වීපය පුරා පැතිරයමින් 32166කට ආසන්න හට සංඛ්‍යාවකින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම පරිපූරක හමුදාව වශයෙන් නිස්වසරක කුරිරු යුද්ධයේ පශ්චාත් අවධිය තුළ රට නැවත ගොඩනැගීමේ මහඟු ක්‍රියාවලියට තම දායකත්වය ලබාදෙමින් සිටියි. ශ්‍රී ලංකාව පුරා ඉතාමත් ශක්තිමත්ව විහිදුනු මෙම දෙපාර්තමේන්තුව තම ප්‍රධාන රාජකාරීන්ට අමතරව කෘෂිකාර්මික ව්‍යාපෘතීන් සඳහා ප්‍රධාන ලෙස සක්‍රීයව දායකත්වය සපයන අතර ශ්‍රී ලංකා කජු නිෂ්පාදනයේ පුළුල් මෙහෙයක් ඉටුකරමින් අපනයන බෝග ශ්‍රී ලංකාව තුළ වර්ධනය කිරීමට ද වර්තමානයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් ක්‍රියා කරමින් සිටිති. තවද අලි මිනිස් ගැටුම අවම කිරීම උදෙසා වනජීවී දෙපාර්තමේන්තුව හා සම්බන්ධතාවයෙන් කටයුතු කරනු ලබන අතර, එහිදී දිවයින පුරා ස්ථාපිත විදුලි වැටවල් 201ක (කි.මී 2113) නඩත්තු කටයුතු සඳහාත්, වන අලි පලවා හැරීමේ රාජකාරී සඳහාත්, වනජීවී කාර්යාල වෙත සිවිල් ආරක්ෂක සාමාජිකයින් 3856 දෙනෙකු යොදවා ඇත.

එමෙන්ම දැනට දීඝවාපිය චෛත්‍ය, නීලගිරිය චෛත්‍ය ඇතුළු පුරාණ බෞද්ධ සිද්ධස්ථාන නැවත වරක් ලෝකවාසී බෞද්ධ බැතිමතුන්ට වන්දනාමාන කිරීම උදෙසා ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම දිවයින පුරා විසිරුණු ආගමික සිද්ධස්ථාන නඟා සිටුවීමේ කාර්යය සඳහාත්, විවිධ බාහිර පාර්ශවයන් වෙතින් එල්ලවන බලපෑම්වලින් බෞද්ධ මධ්‍යස්ථාන මෙන්ම පුරාවිද්‍යා වටිනාකමක් ඇති ආගමික ස්ථාන ආරක්ෂා කිරීමේ කාර්යය සඳහාත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින් තම දායකත්වය ලබාදෙමින් සිටිති. විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම පරිදි එම ආයතනවල ආරක්ෂක රාජකාරීන් ද ශ්‍රී ලංකා පොලීසිය සමඟ එක්ව නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් වෙමින් ද, රටට අත්‍යාවශ්‍ය වූ සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් ඉතාමත් කාර්යක්ෂම මෙන්ම ඉහළ ගුණාත්මක භාවයකින් යුක්තව සාපේක්ෂව අඩු පිරිවැයකින් ඉටු කිරීමේ කාර්යයට ද වර්තමානයේ මෙම දෙපාර්තමේන්තු සාමාජිකයන් දායකත්වය ලබා දී ඇත.

ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත ගරු නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමාගේ හා ආරක්ෂක ලේකම් තුමාගේ මාර්ගෝපදේශයෙන් රටේ කෘෂි කර්මාන්තය මෙන්ම අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා මෙම දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන්ගේ සේවය ලබාදෙන අතර, පසුගිය වසර තුළ දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් ඉලක්ක හා අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට හැකියාව ලැබී ඇත. එහිදී මෙම දෙපාර්තමේන්තුව වෙතින් 2024 වර්ෂය සඳහා උත්පාදනය කිරීමට ඇස්තමේන්තු ගත කළ ආදායම රුපියල් මිලියන 1580 වුවද, රුපියල් මිලියන 2173.7 ක සම්පූර්ණ ආදායමක් උපයා ගැනීමටත්, ඉන් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති බැව් වාර්තා අනුව පෙන්වා දීමට කැමැත්තෙමි.

මෙවන් විශාල සේවයක් රට වෙනුවෙන් සපයන්නා වූ සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ වෘත්තීය දැනුම නංවාලීම සඳහා සුවිශේෂී ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ක්‍රියාවට නංවා ඇති අතර, ඔවුන්ගේ ආකල්ප, කුසලතා මෙන්ම ඔවුන්ගේ සේවා තෘප්තිය ඉහළ නැංවීම උදෙසා විශේෂ ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ආරම්භ කර ඇත. ඒ අතර දිස්ත්‍රික් නිලධාරි පුහුණු පාඨමාලා, ජ්‍යෙෂ්ඨ නියාමකයින් සඳහා නායකත්ව පුහුණු පාඨමාලා හා වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කරමින් ඔවුන්ගේ රාජකාරි කටයුතු මනාව ඉටුකිරීමට අවශ්‍ය දැනුම ලබාදීම මඟින් ඔවුන්ගේ දායකත්වය තවදුරටත් ඉහළ ඵලදායීතාවයකින් ලබා ගැනීමට කටයුතු කර ඇත.

පසුගිය වසරවල මෙන්ම 2024 වර්ෂයේත් නිවාස නොමැති සිවිල් ආරක්ෂක සාමාජිකයින් හට නිවාස ලබාදීම ද, නිවාසවල වැඩ අවසන් කිරීමට නොහැකිවූවන් හට ඒවායේ වැඩ අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ද තම දුවා දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය පොත්පත් ආදිය නොමිලේ ලබාදීම ද මේ වන විට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සිදුකරමින් පවතී. එමඟින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ සාමාජීය තත්ත්වයන් ඉහළ නැංවීම මූලික පරමාර්ථය වී ඇත.

එසේම දිවයින පුරා ග්‍රාමීය මට්ටමින් ඩෙංගු උවදුර මැඩපැවැත්වීම උදෙසා ශ්‍රමදාන කාර්යයන් හා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සමඟ සම්බන්ධතාවයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීමත්, මතින් තොර දේශයක් බිහිකරලීමේ කාර්යය වෙනුවෙන් පුහුණුවලත් උපදේශකයින් මඟින් මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමත්, ලේ දන් දීමේ වැඩසටහන් සඳහා දායකත්ව සැපයීමත්, ජීවිතාරක්ෂක කණ්ඩායම් මඟින් දෙස් විදෙස් ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමේ කාර්යයන් ඉටුකිරීමත් වැනි සමාජ සුබ සාධන කාර්යයන්හි නිරත වීම හා ඒ පිළිබඳ දෙපාර්තමේන්තු සාමාජිකයින් ඇගයීමට ලක්වීම ඉතා ප්‍රශංසනීය වනු ඇත.

මාතෘ භූමියේ තිරසර සංවර්ධනය නංවාලීම සඳහා මෙන්ම නීතිය හා සාමය පවත්වාගෙන යාම උදෙසා අවශ්‍ය සහය උපරිම ලෙස ලබා දීමටත්, මෙම වසරේදී **"පොහොසත් රටක්,ලස්සන ජීවිතයක්"** යන තේමාව යටතේ ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රවේශයට අනුගත වෙමින් අප වෙත පැවරෙන සියළුම වගකීම් කැපවීමෙන් මෙන්ම හැකි උපරිම අයුරින් ඉටු කිරීමටත් අප මාතෘභූමිය ගොඩනැංවීමේ කාර්යය උදෙසා ලබාදිය හැකි උපරිම දායකත්වය ලබා දීමට අපේක්ෂා කරන අතරම එම කාර්යයන් උසස් ඵලදායීතාවයකින් ලබාදීම උදෙසා නිලධාරීන් ඇතුළු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන් හටත්, සිවිල් කාර්යය මණ්ඩලයටත් අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබෙවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

මේජර් ජෙනරල් කේඑච්පීපී ප්‍රනන්දු (විශ්‍රාමික)
ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ
අධ්‍යක්ෂ ජනරාල්

දෙපාර්තමේන්තු පරිපාලන කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	එයාර් වයිෂ් මාර්ෂල්	ආර්එස් බියන්විල (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී එම්බීඒ(එක්සත් රාජධානිය) එන්ඩීසී(ඉන්දියාව) පීඑස්සී	අධ්‍යක්ෂ ජනරාල්
2	ස්කෝඩ්‍රන් ලීඩර්	කේඑච්ඒඑස්අයි සඳරුවන්	අධ්‍යක්ෂ ජනරාල් සහකාර ලේකම්
3	ස්කෝඩ්‍රන් ලීඩර්	ආර්එම්ඒඑස් බංඩාර	අධ්‍යක්ෂ ජනරාල් අධිසහායක

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	බ්‍රිගේඩියර්	එම්ඒඑස් වැලිගම	අධ්‍යක්ෂ මෙහෙයුම්
2	බ්‍රිගේඩියර්	අයිඩීඩී ප්‍රනාන්දු (විශ්‍රාමික)	අධ්‍යක්ෂ පිරිස් පාලන
3	කර්නල්	යූවීඩබ්එස් අමරසිරි	අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන/පුහුණු)
4	කර්නල්	ඩීඩීඩී සේරසිංහ	අධ්‍යක්ෂ පාලන
5	කර්නල්	ජේකේ දිසානායක	අධ්‍යක්ෂ ඉදිකිරීම් හා ව්‍යාපෘති
6	ලුතිනන් කර්නල්	එච්එම්ආර්පී කුමාර	අණදෙන නිලධාරි - මුලතිව්
7	ලුතිනන් කර්නල්	ඩීඑම්ආර්කේබී නවරත්න ආර්ඩබ්ලිපිආර්එස්පීජී	අණදෙන නිලධාරි - පොලොන්නරුව
8	ලුතිනන් කර්නල්	ඩබ්එච්එම්සී විජයවර්ධන	මූලස්ථාන අණදෙන නිලධාරි
9	ලුතිනන් කර්නල්	යූජීර්කේඑන්අයි උඩදිවෙල ආර්ඩබ්ලිපි ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - මොණරාගල
10	ලුතිනන් කර්නල්	එල්ආර්එම්යූබී රත්නායක ආර්එස්පී	අණදෙන නිලධාරි - සේරුපිට
11	ලුතිනන් කර්නල්	යූඑච්ටිඑන් පෙරේරා	මාණ්ඩලික නිලධාරි ව්‍යාපෘති (සේවා වනිතා)
12	ලුතිතන් කර්නල්	ඩබ්එම්ජී විජේතුංග යූඑස්පී	අණදෙන නිලධාරි - වැලිඔය
13	ලුතිතන් කර්නල්	යූජීඑස්කේඑස්සී සෝමපාල යූඑස්පී අයිඑස්සී	අණදෙන නිලධාරි - විශ්වමඩු
14	ලුතිතන් කර්නල්	ඩීඑම්එල්ටී දිසානායක යූඑස්පී පීඑස්සී අයිජී	අණදෙන නිලධාරි - අනුරාධපුර
15	ලුතිනන් කර්නල්	එච්බීඑම්බීඑන් බංඩාර ආර්ඩබ්ලිපි ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - හොරොව්පොතාන
16	කර්නල්	කේජේආර්එස් පෙරේරා	දෙවන අණදෙන නිලධාරි - වෙන්නවත්ත
17	ලුතිනන් කර්නල්	ටීඑම්එන්ආර් තැන්නේ ආර්ඩබ්ලිපිආර්එස්පියූඑස්පී	අණදෙන නිලධාරි - මහඔය
18	ලුතිනන් කර්නල්	ජීආර්එච් වර්ණජිත් ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - වව්නියාව
19	ලුතිනන් කර්නල්	ඩබ්ඊඑම්සී ඒකනායක යූඑස්පී පීඑස්සී	අණදෙන නිලධාරි - කටුනායක
20	ලුතිනන් කර්නල්	කේකේඑම්කේඩබ් කහටපිටිය අයිජී	අණදෙන නිලධාරි - විල්පත්තු
21	ලුතිනන් කර්නල්	ඊආර්කේ එදිරිමුණි ආර්ඩබ්ලිපි	අණදෙන නිලධාරි - අම්පාර
22	ලුතිනන් කර්නල්	ඒඅයි හෙට්ටිආරච්චි	නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රවාහන
23	ලුතිනන් කර්නල්	එම්ඒසී ගුණරත්න කේඑස්පී	නියෝජ්‍ය අධ්‍යක්ෂ පිරිස් පාලන

24	ලුතිනන් කර්නල්	ජේඑම්ඩබ්ලිව් බංඩාර ආර්එස්පී පීඑස්සී	අණදෙන නිලධාරි - පුත්තලම
25	මේජර්	එම් මිල්ලවාන	අණදෙන නිලධාරි - කිලිනොච්චි
26	ලුතිනන් කර්නල්	එච්ටීපී කුමාරසිරි	වනජීවී සම්බන්ධිකරණ නිලධාරි
27	ලුතිනන් කර්නල්	ඒඑස්සී ද සිල්වා ආර්ඩබ්ලිපී ආර්එස්පී	අණදෙන නිලධාරි - කල්පිටිය පුහුණු පාසල
28	ලුතිනන් කර්නල්	ඩබ්එම්ජීජේ වනිගසේකර	අධ්‍යක්ෂ සුබසාධක
29	ලුතිනන් කර්නල්	එච්විසීජේ හපුආරච්චි ආර්ඩබ්ලිපී යූඑස්පී	අණදෙන නිලධාරි - පහලලන්ද පුහුණු පාසල
30	ලුතිනන් කර්නල්	ජීආර් විමලසිරි	අණදෙන නිලධාරි - ගෝමරන්කඩවල
31	ලුතිනන් කර්නල්	ජීඅයිඩබ්ලිව් ගීකියනගේ	අණදෙන නිලධාරි - සේරුවිල
32	ලුතිනන් කර්නල්	එච්එම්එස්ඩිකේ හේරත්	අණදෙන නිලධාරි - මහනුවර
33	ලුතිනන් කර්නල්	ඩීඑල්වයිඒ ලක්පුර	අණදෙන නිලධාරි - උහන
34	ලුතිනන් කර්නල්	එස්වයි ශ්‍රීමාල්	අණදෙන නිලධාරි - කතරගම
35	ලුතිනන් කර්නල්	එම් කහටපිටිය	අණදෙන නිලධාරි - විල්පත්තු
36	ලුතිනන් කර්නල්	ඒයූ ප්‍රියන්ත ආර්එස්පී	අණදෙන නිලධාරි - කැබිතිගොල්ලෑව
37	ලුතිනන් කර්නල්	එච්යූපීකේ සිල්වා	අණදෙන නිලධාරි - ගල්කිරියාගම
38	මේජර්	ඒ වර්ණකුලසූරිය	මාණ්ඩලික නිලධාරි (ඉදිකිරීම් හා නඩත්තු)
39	මේජර්	ඩබ්ආර් ප්‍රසන්න	මාණ්ඩලික නිලධාරි(ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරි)
40	මේජර්	ආර්එස්එම් විජේසිංහ	මාණ්ඩලික නිලධාරි - විශ්‍රාම වැටුප්
43	මේජර්	කේසී අකලංක ආර්එස්පී	අණදෙන නිලධාරි - ත්‍රිකුණාමලය
45	මේජර්	එම්ඒඩී කුමාර	අණදෙන නිලධාරි - මැදිරිගිරිය
46	මේජර්	පීජීටී ජයසිංහ	නීති නිලධාරි
47	මේජර්	කේජේආර්එස් පෙරේරා	දෙවන අණදෙන නිලධාරි
48	මේජර්	එච්කේඑස් ප්‍රදීප්	දෙවන අණදෙන නිලධාරි - අම්පාර
49	මේජර්	ජේපී විජේතුංග	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (ව්‍යාපෘති)
50	මේජර්	එච්එම්එන්එන් ප්‍රේමජයන්ත	මාණ්ඩලික නිලධාරි(ආරක්ෂක සේවා සම්බන්ධිකරණ නිලධාරි)
51	මේජර්	ආර්ඩීආර්එම් ජයලත්	නඩත්තු හා ප්‍රවාහන නිලධාරී
52	කපිතාන්	ටීඩබ්එම්කේ අබේසිංහ ආර්ඩබ්ලිපී	වැලිසර උප බලකාය
53	කපිතාන්	යූකේආර්සී උඩවත්ත	පල්ලසේන ව්‍යාපෘති සම්බන්ධිකරණ නිලධාරි

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	රියර් අද්මිරාල්	ඩබ්ඩිවීඑම් සුදර්ශන (විශ්‍රාමික) ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
2	කොමදෝරු	ජේඒකේඑස් ජයකොඩි බීඒ(ඩීඑස්) එල්එල්එම්සී	අධ්‍යක්ෂ ප්‍රසම්පාදන
3	කපිතාන්	ආර්පීඑස් රණසිංහ	අණදෙන නිලධාරි - කටුනායක
4	කපිතාන්	එන්සිපිඑන් නානායක්කාර	ස්ථානභාර නිලධාරි - විශේෂ විමර්ෂන ඒකකය
5	කොමාණ්ඩර්	ආර්ජේඩී රණවීර	මාණ්ඩලික නිලධාරි - ප්‍රවාහන (නඩත්තු)
6	කොමාණ්ඩර්	ඩබ්ටී විජේරත්න	අණදෙන නිලධාරි - කොණ්ඩව්වි
7	ලුතිනන් කොමාණ්ඩර්	එච්ජේජේ ගුණවර්ධන	දෙවන අණදෙන නිළධාරී- මූලස්ථානය
8	ලුතිනන් කොමාණ්ඩර්	ඒඑම්සීආර් කුමාර	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි - මණ්ඩල අධ්‍යනය හා විමර්ෂන

9	ලුතිනන් කොමාණ්ඩර්	එස්එම්ඒ ශාන්ත	දෙවන අණදෙන නිලධාරි - මහඔය
10	ලුතිනන් කොමාණ්ඩර්	එන්එස් කුමාරජෝති	නියෝජ්‍ය අධ්‍යක්ෂ තාක්ෂණ
11	ලුතිනන් කොමාණ්ඩර්	ඩීඒඑස් සඳරුවන්	මාණ්ඩලික නිලධාරි - ප්‍රසම්පාදන
12	ලුතිනන් කර්නල්	සී මාරසිංහ	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)

ශ්‍රී ලංකා පොලිස් කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	ප්‍රපොප	යූ අරුලානන්දම්	ස්ථානාධිපති -පොලිස් අංශය
2	පොප	ජේඑල්පී ප්‍රියදර්ශන	දෙවන අණදෙන නිලධාරි - මහනුවර
3	පොප	එස්එස් සමන්ත	ස්ථානාධිපති - ලාහුගල උප බලකාය
4	පොප	එම්ඒපීආර්කේ මුණසිංහ	දෙවන අණදෙන නිලධාරි - සේරුවිල
5	පොප	ඩීඑච්එල්ඩබ් ජයසිංහ	ස්ථානාධිපති - මිහින්තලය උප බලකාය
6	පොප	එච්ආර්ආර්පී ගුණරත්න	දෙවන අණදෙන නිලධාරි - පොලොන්නරුව
7	උපොප	වයිබීඑන් බන්දුල	දෙවන අණදෙන නිලධාරි - හොරොව්පොතාන
8	උපොප	එච්එම්එල්ටී හේරත්	දෙවන අණදෙන නිලධාරි - සේරුපිට පුහුණු පාසල
9	උපොප	පීකේ ජයතුංග	දෙවන අණදෙන නිලධාරි - ගෝමරන්කඩවල
10	උපොප	බීජීඒටී බංඩාර	මාණ්ඩලික නිලධාරි - වැලිසර ගබඩාව
11	උපොප	එස්එස් තිලකරත්න	මාණ්ඩලික නිලධාරි - මූලස්ථාන බලඇණිය
12	උපොප	ඩබ්එම්ආර්කේ වික්‍රමසිංහ	දෙවන අණදෙන නිලධාරි - පහලලන්ද
13	උපොප	ජේ විජේවර්ධන	දෙවන අණදෙන නිලධාරි - අනුරාධපුර
14	උපොප	ඩබ්එම්ඩබ් කුලතිලක	මාණ්ඩලික නිලධාරි - විහාරමහාදේවී උද්‍යානය
15	උපොප	වීටීජීඩීටීසී ප්‍රියදර්ශන	දෙවන අණදෙන නිලධාරි - කටුනායක
16	උපොප	බීජී ගාමිණී	අතිරේක නිලධාරි - මැදිරිගිරිය
17	උපොප	එච්ඩී චන්ද්‍රසිරි	අතිරේක නිලධාරි - වැලිසර
18	උපොප	ආර්ඩී ගුණරත්න	අතිරේක නිලධාරි - සේරුපිට
19	උපොප	ඒපීජේ පිටදෙණිය	දෙවන අණදෙන නිලධාරි - වැලිඔය

දීප ව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය

අ/අ	ස්ථිර සේවය	නිලධාරියාගේ නම	තනතුර
1	ශ්‍රීලංගසේ I	ආර්ආර් බුලත්සිංහල මහත්මිය	අධ්‍යක්ෂ මුදල්
2	ශ්‍රීලංගසේ II	ජේඒ ජෙරිඩ් මහතා	සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
3	ශ්‍රීලංගසේ III	වීආර් සම්පත් මහතා	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 320

පටුන

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය 3

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය....3

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය 4

ශ්‍රී ලංකා පොලිස් කාර්ය මණ්ඩලය හා දීප ව්‍යෘජ්ත සේවා කාර්ය මණ්ඩලය 5

1 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 8

1.1 **හැඳින්වීම**....8

1.2 **ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු** 8

1.2.1 **දැක්ම** 8

1.2.2 **මෙහෙවර** 8

1.3 ප්‍රධාන කාර්යයන්....8

1.3.1 **සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති**....9

1.4 **සංවිධාන සටහන** 10

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ....12

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 13

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 13

2 **ප්‍රගතිය හා ඉදිරි දැක්ම** 14

2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය 14

2.1.1 එක් එක් බලකා මූලස්ථාන , පුහුණු කඳවුරු මඟින් 2024 වර්ෂය තුළ රජයේ ආදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන 15

2.2 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය 16

2.3 ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය 17

2.4 යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘතිය 17

2.5 ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය....18

2.7 ගුරු හිඟය පවතින දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ස්වේච්ඡා ගුරුවරුන් අනුයුක්ත කිරීම 19

2.8 දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන වෙතින් ක්‍රියාවට නංවා ඇති කෘෂි ව්‍යාපෘති 19

2.9 ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම 21

2.10 මත් උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ..21

2.11 දෙපාර්තමේන්තුමය සුභසාධන ක්‍රියාකාරකම් 22

2.12 නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි 22

3 **2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය** 23

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 23

ඒසිඒ - එෆ් 23

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 25

ඒසිඒ -පි 25

2024 දෙසැම්බර් 31 දිනට 25

3.3 **මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය** 26

ඒසිඒ-සී 26

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 28

3.4.1 වාර්තා කිරීමේ පදනම 28

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 29

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 29

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 30

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 30

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 31

4 **කාර්යසාධනදර්ශක** 32

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 49

5 **තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** 50

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 50

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 53

5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ 53

5.2.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග 53

6 **මානවසම්පත්පැතිකඩ** 37

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 54

6.2 මානව සම්පත් සංවර්ධනය 55

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය 56

7 **අනුකූලතාවාර්තාව** 41

1 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1985 අංක 40 දරන මිනිස් බල උපයෝගීතා සහ පරිපූරක හමුදා පනතේ 52 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිස් සේවාවට ආධාර හා උපකාරීවීමේ කාර්ය සඳහා පිහිටුවන ලද ග්‍රාමාරක්ෂක හමුදාව, 2006.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (අමප/06/135/206/052) අනුව "සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව" නමින් නව දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 26ක් සහ පුහුණු පාසල් 02ක් ස්ථාපිත කර ඇති අතර 32166කට ආසන්න ශ්‍රම බලකායක් සේවයේ යෙදී සිටී.

2015 ජූනි මස 12 දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ පැවති දිස්ත්‍රික් නිලධාරී, පාලක/නියාමක, උප පාලක/උප නියාමක, ග්‍රාම ආරක්ෂක/සිවිල් ආරක්ෂක තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශයට පත් කර ඇත. තවද 2015 මාර්තු මස 05 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම දෙපාර්තමේන්තුව සතු සුවිශාල මිනිස් බල සංචිතය ඵලදායී ලෙස යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල සංවර්ධන කටයුතු සිදු කිරීමේ හැකියාව සහ දෙපාර්තමේන්තුව ආදායම් උත්පාදනය කරන ආයතනයක් බවට පත්කිරීමේ හැකියාව සලකා දෙපාර්තමේන්තු කාර්යභාරය තවදුරටත් පුළුල් කරනු ලැබීය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 දැක්ම

“ තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් ”

1.2.2 මෙහෙවර

“ශ්‍රී ලංකා මාතෘ භූමියේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට දිවි හිමියෙන් කැප වෙමින් ද, ජාතික සංවර්ධන හා ආර්ථික වර්ධන ඉලක්ක සාක්ෂාත් කරමින් ද, ‘පරිපූරක ශ්‍රම ආර්ථික බලකායක්’ ලෙස සෞභාග්‍යයේ දැක්මට විශිෂ්ට පෙර ගමන්කරුවකු වීම.”

1.3 ප්‍රධාන කාර්යයන්

1. රටතුළ උද්ගතවන ආරක්ෂක තත්ත්වයන් අනුව අවස්ථාවට උචිත පරිදි සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවාවට ආධාර හා උපකාරී වීම සඳහා පරිපූරක හමුදාවක් වශයෙන් කටයුතු කිරීම.
2. ත්‍රස්තවාදී තර්ජන පවතින අවස්ථාවලදී ඊට ලක්වන ගම්බිම් හා නගර ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
3. රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා සන්නද්ධ හමුදාවන්ට සහ පොලිස් සේවාවට සහාය දීම.
4. ජාතික වැදගත්කමක් ඇති උත්සව හා වෙනත් වැදගත් අවස්ථාවන්හිදී ඊට අදාළ ආරක්ෂාව සැලසීමේ කටයුතුවල යෙදීම.
5. රට තුළ ඇතිවන විවිධ ආපදා අවස්ථාවන්හිදී (ගංවතුර, සුනාමි, නායයාම් වැනි) ආපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම.
6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටු කරවා ගැනීමේදී ශ්‍රම බලකායේ සේවය ලබාදීම.

7. රාජ්‍ය ආයතනවලට ආරක්ෂක සේවා සපයා ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුව සමග ගිවිසුම්ගතව ආරක්ෂක සේවාවන් ලබාදීම.

8. දෙපාර්තමේන්තුව සතු සංස්කෘතික කණ්ඩායම්වල සේවය රාජ්‍ය ආයතනවල උත්සව අවස්ථාවන් සඳහා ලබාදීම.

9. අලි මිනිස් ගැටුම් හේතුවෙන් අදාළ ප්‍රදේශවල සිදුවන හානි අවම කිරීම පිණිස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහායවීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සේවය එම දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.

10. දිවයින පුරා පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සඳහා අවශ්‍ය වන පරිදි ආරක්ෂාව සැලසීම.

11. සමාජ සුබසාධන ක්‍රියාකාරකම්වලට සහාය වීම.

12. ජනාධිපතිතුමා, විෂයභාර අමාත්‍යතුමා හෝ රජය විසින් නියම කරනු ලබන විශේෂිත කාර්යයන්වල යෙදීම.

1.3.1 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති

අංක 1462 / 20 හා 2006.09.13 දිනැති ඇති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අ/ම/ප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් පවරන ලද ඉහත රාජකාරිවලට අමතරව, රජය විසින් වරින් වර පහත සඳහන් රාජකාරි ද පවරා ඇත.


- දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පලතුරු, පශු, සම්පත් ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මඟින් රටේ ජාතික ආහාර නිෂ්පාදනය ශක්තිමත් කිරීම.

- අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් යහපත් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම.

- ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම.


- උතුරු හා උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරණ යන්ත්‍ර ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම.

1.4 සංවිධාන සටහන


සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
සම්බන්ධිත රියදුරු - 30, නියමික (විශේෂ /I) - 3200, උප නියමික - 6510, සිවිල් ආරක්ෂකභට - 39790, නියමික (විශේෂ) රියදුරු - 30, නියමික (I) - 70, , උප නියමික රියදුරු - 90, සිවිල් ආරක්ෂක භට රියදුරු - 210,
සහනාරක්ෂක කම්කරු - 30

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු

බලකා/පුහුණු පාසල්/ව්‍යාපෘති කාර්යාල ස්ථානගත වීම



සිතියම් යතුර		
මූලස්ථානය		1
බලකා මූලස්ථාන		26
පුහුණු කඳවුරු		2
ව්‍යපෘති කාර්යාල		३

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 26 ක් සහ පුහුණු පාසල් 02ක් සහ විශේෂ ව්‍යාපෘති කාර්යාල 03 ක් ක්‍රියාත්මක වන අතර බලකා මූලස්ථාන/පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සහ දෙවන අණදෙන නිලධාරීන් මඟින් එකිනෙක බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්හි පරිපාලන කටයුතු සිදු වේ.

එහිදී මෙම දෙපාර්තමේන්තුව සතු 32,166කට ආසන්න සිවිල් ආරක්ෂක සාමාජික/සාමාජිකාවන්ගෙන් සමන්විත මානව සම්පත විවිධ ක්ෂේත්‍රගත ව්‍යාපෘති වෙත යොමු කරවීම දෙපාර්තමේන්තු මූලස්ථානයේ මෙහෙයවීමෙන් බලකා මූලස්ථාන/පුහුණු පාසල් මඟින් සිදු කෙරේ.

බලකා මූලස්ථාන - 26

1. දෙපාර්තමේන්තු මූලස්ථානය
2. වෙන්නවත්ත බලකා මූලස්ථානය
3. කටුනායක බලකා මූලස්ථානය
4. මහනුවර බලකා මූලස්ථානය
5. පුත්තලම බලකා මූලස්ථානය
6. අනුරාධපුර බලකා මූලස්ථානය
7. විල්පත්තුව බලකා මූලස්ථානය
8. වව්නියාව බලකා මූලස්ථානය
9. කිලිනොච්චි බලකා මූලස්ථානය
10. විශ්වමඩු බලකා මූලස්ථානය
11. මුලතිව් බලකා මූලස්ථානය
12. වැලිඔය බලකා මූලස්ථානය
13. කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය
14. හොරොව්පොතාන බලකා මූලස්ථානය
15. ගෝමරන්කඩවල බලකා මූලස්ථානය
16. ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය
17. සේරුවිල බලකා මූලස්ථානය
18. පොළොන්නරුව බලකා මූලස්ථානය
19. මැදිරිගිරිය බලකා මූලස්ථානය
20. මහඔය බලකා මූලස්ථානය
21. උහන බලකා මූලස්ථානය
22. අම්පාර බලකා මූලස්ථානය
23. මොණරාගල බලකා මූලස්ථානය
24. කතරගම බලකා මූලස්ථානය
25. සේරුපිට බලකා මූලස්ථානය
26. පහලළන්ද බලකා මූලස්ථානය

පුහුණු පාසල් - 02

1. කල්පිටිය පුහුණු පාසල
2. ගල්කිරියාගම උසස් පුහුණු පාසල

දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්වලට අදාළ පාලන කටයුතු සිදු කරන අතර දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශ 23ක් යටතේ එම පාලන කාර්යන් විමධ්‍යගත කර ඇත.

i. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය
ii. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
iii. අභ්‍යන්තර විගණන අංශය
iv. ආයතන අංශය
v. ගිණුම් අංශය
vi. වැටුප් අංශය
vii. මෙහෙයුම් අංශය
viii. පිරිස් පාලන අංශය
ix. ප්‍රසම්පාදන අංශය
x. ප්‍රවාහන අංශය
xi. පුහුණු අංශය
xii. ව්‍යාපෘති අංශය
xiii. සුබසාධක අංශය
xiv. තාක්ෂණ හා නඩත්තු අංශය
xv. පර්යේෂණ හා සංවර්ධන අංශය
xvi. මාධ්‍ය අංශය
xvii. ක්‍රීඩා අංශය
xviii. පෞද්ගලික ලිපි ගොනු අංශය
xix. විදුලි වැට සම්බන්ධීකරණ ඒකකය
xx. සේවා වනිතා ඒකකය
xxi. යහසාධක අරමුදල
xxii. සුවසවිය අරමුදල
xxiii. විශ්‍රාම වැටුප් අංශය

එක් එක් බලකා මූලස්ථාන, පුහුණු පාසල් සහ දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශයන්ට අදාළව 2024 වර්ෂය සඳහා සැලසුම්ගත කාර්යන්හි කාර්යසාධනය වෙන් වෙන්ව දක්වා ඇත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

- සුවසවිය අරමුදල
- යහසාධක අරමුදල
- සුබසාධන අරමුදල
- ක්‍රීඩා අරමුදල
- ආගමික අරමුදල
- සේවා වනිතා අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම -

ආ) දායක නියෝජිතායතනය -

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මි -

ඈ) ව්‍යාපෘති කාල සීමාව -

} නැත

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම


2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යුධ විජයග්‍රහණයෙන් පසු නැගෙනහිර නවෝදය, උතුරු වසන්තය, සෞභාග්‍යයේ පෙර දැක්ම වැනි රජයේ ජාතික සංවර්ධන සංග්‍රාමයන්ට දායක විය. ඒ අනුව, රටේ ආහාර ඉල්ලුමට සරිලන වී, ධාන්‍ය, එළවලු වැනි මහා පරිමාණ කෘෂි, පශු ව්‍යාපෘතීන් ද, ගඩොල්, බිලොක් ගල් වැනි ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ව්‍යාපෘතීන් ද ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතීන් මේ වන විට වාර්ෂිකව ඉතා විශාල මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබන දීර්ඝ කාලීන ආයෝජන ලෙස ක්‍රියාත්මක වන අතරම, රටේ ජාතික සංවර්ධනයට ද අඛණ්ඩ දායකත්වයක් දරනු ලබයි.

ඊට අමතරව මෙම දෙපාර්තමේන්තු සාමාජිකයින් රාජ්‍ය ආයතන වල ආරක්ෂක රාජකාරි, නර්තන හා සංගීත කණ්ඩායම් සේවා, ඉදිකිරීම්, නඩත්තු හා විවිධ සේවා සැපයීම තුළින් ද ආදායම් උත්පාදනය කිරීමට සමත් වී ඇත.

රජයේ ආහාර සුරක්ෂිතතා වැඩපිළිවෙල සාක්ෂාත් කර ගැනීම සඳහා 2024 වර්ෂයේ වී වගාවෙන් අස්වැන්න කිලෝ 3,610,493 ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇති අතර රු 409,819,430.30 ක අදායමක් රජයට ලබා දී ඇත. ඒ අනුව, සමස්ථ දෙපාර්තමේන්තුවේ ආදායම් ලෙස, 2024 වර්ෂය තුළ පමණක් රුපියල් 2,173,800,711.41 ක් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැර කර ඇත.

ව්‍යාපෘති කාණ්ඩය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි
ව්‍යාපෘති	295	631	541	375	382	482.5	379.2	655.3	907.8	1,363.18
ආරක්ෂක සේවා	25	204	312	491	606	375.7	320.5	741.7	528.9	638.30
නර්තන හා සංගීත	-	27	11	6	17	3	1.6	4.6	4.6	1,60
නඩත්තු සේවා	-	23	19	22	24	17.5	25.58	67.3	28.5	79.87
ඉදිකිරීම් සේවා	-	30	58	87	102	90.5	1.57	6.4	8.6	27.09
විවිධ	3	141	202	16	25	9	41.06	89.7	67.1	63.77
එකතුව	323	1,056	1,143	997	1,156	978.2	769.5	1565	1545.5	2,173.81




2.1.1 එක් එක් බලකා මූලස්ථාන , පුහුණු කඳවුරු මඟින් 2024 වර්ෂය තුළ රජයේ ආදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන

2024 වර්ෂයට අදාළව ඉහත 2.1. වගුව මඟින් කෘෂි, පශු, ගඩොල් යන කාණ්ඩ යටතේ පොදුවේ දක්වා ඇති ආදායම් ඒ ඒ බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වෙන් වෙන් වශයෙන් ඒ ඒ ආයතනයන්හි ප්‍රගතිය ලෙස පහත දක්වා ඇත. තවද, පහත දක්වා ඇති ආදායම් හා ව්‍යාපෘති ඒ ඒ බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වැඩිදුරටත් සවිස්තරාත්මකව දක්වා ඇත.

බලකා මූලස්ථාන / පුහුණු පාසල් / උප බලකා / ව්‍යාපෘති	2024 වර්ෂයේ රජයේ ආදායමට බැර කරන ලද මුදල (රු.)
අම්පාර	90,566,334.20
අනුරාධපුර	14,361,762.92
ගෝමරන්කඩවල	50,972,002.39
හොරොව්පතාන	51,181,439.88
කැබතිගොල්ලෑව	52,591,399.90
මහනුවර	237,900.00
ත්‍රිකුණාමලය	143,109,269.62
කතරගම	2,074,127.50
කටුනායක	18,150.00
කිළිනොච්චිය	54,749,095.50
කුරගල	-
මැදිරිගිරිය	47,719,245.59
මහඔය	39,254,567.00
මොණරාගල	175,157,753.26
මුලතිව්	34,080,773.65
පොළොන්නරුව	107,285,614.58

බලකා මූලස්ථාන / පුහුණු පාසල් / උප බලකා / ව්‍යාපෘති	2024 වර්ෂයේ රජයේ ආදායමට බැර කරන ලද මුදල (රු.)
පුත්තලම	28,278,070.00
සේරුවිල	88,828,653.25
උහන	76,514,035.94
විල්පත්තුව	44,577,663.01
වවුනියාව	57,350,515.01
වැලිඔය	78,793,771.20
වෙන්නවත්ත	276,040.00
කොණ්ඩච්චි	65,646,165.71
ගල්කිරියාගම	555,150.00
විශ්වමඩු	36,251,579.87
මිහින්තලය	-
කල්පිටිය	3,271,329.00
මූලස්ථානය/සේරුපිට	280,800.00
පහළලන්ද	14,407,270.46
එකතුව	**1,360,972,938.19**



2.2 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය

යුධ විජයග්‍රහණයෙන් අනතුරුව රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවාවට සහාය වීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වේ. ඒ අනුව 2024 වර්ෂය තුළ දිවයින පුරා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මානව සම්පත් විවිධ කාර්යන් සඳහා පහත පරිදි යොදවා ඇත.මෙම කාර්යයන් ඉදිරි වර්ෂයන්හී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ඊට අමතරව පහත පරිදි දෙපාර්තමේන්තුවේ මානව සම්පත විවිධ කාර්යයන්හි යොදවා ඇත. තවද විවධ අපදා අවස්ථා සඳහා සහාය වීම හා මැතිවරණ රාජකාරි සඳහා සහාය වීම වැනි කාර්යයන් සිදු කෙරෙනු ඇත.
ඊට අමතරව පහත පරිදි දෙපරේතමේන්තුවේ මානව සම්පත විවිධ කාර්යයන්හි යොදවා ඇත.

කාර්යය	භට සංඛ්‍යාව
පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා	305
රාජ්‍ය ආයතන සඳහා ආරක්ෂාව සැපයීම	1797
විදුලි වැට නඩත්තු හා කාර්යාල කටයුතු සඳහා	2949
වන අලි කළමනාකරණය හා වන අලි පලවා හැරීම	838
පොලිස් ස්ථාන සඳහා	1705
ඉදිකිරීම් රාජකාරි	390
ආගමික ස්ථාන සඳහා	2548









2.3 ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය

ජාතික නිදහස් සැමරුම් උළෙල සඳහා තූර්යවාදක කණ්ඩායම් සාමාජිකයින් 110 ක්ද සම්මාන පෙළපාලිය වෙනුවෙන් 81 ක සමන්විත කණ්ඩායමක්ද,කාන්තා කණ්ඩායම වෙනුවෙන් සාමාජිකාවන් 81 දෙනෙකු හා නන්දිමිත්‍ර කණ්ඩායම වෙනුවෙන් සාමාජිකයින් 81 දෙනෙකු ඇතුළු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සාමාජික/සාමාජිකාවන් 353 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගී කරවන ලදී.





2.4 යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘතිය

2013.04.26 වන දින එවකට ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් කුරගල සංචාරයේදී අන්‍යාගමික ග්‍රහණයට නතුවී තිබූ කුරගල පුරාවිද්‍යා ස්මාරක සහිත පූජණීය ස්ථානය මුල්කොට ගෙන එම ගමෙහි පදිංචි තරුණ පිරිස් 54 දෙනෙකු බදවාගෙන කුරගල පුජා භූමි සංරක්ෂණ කටයුතු සඳහා යොදවා ඇත. පසුව එම කටයුතු අවසන් වූ පසු මෙම ස්ථානය වෙන්නවත්ත බලකා මූලස්ථානයට අනුබද්ධ ව්‍යාපෘති කාර්යාලයක් බවට පත්කර ඉන් අනතුරුව කතරගම බලකායට අනුයුක්තව පවත්වාගෙන යන අතර මේ වන විට 200 කින් යුත් හට පිරිසක් සමග කුරගල ව්‍යාපෘති කාර්යාලය නමින්, රාජ්‍ය ආයතන ආරක්ෂක රාජකාරි, ආදීයෙහි හටපිරිස් යොදවා පවත්වාගෙන යනු ලබයි. 2024 වර්ෂයේදී කුරගල ව්‍යාපෘතිය බලකා මූලස්ථානයක් බවට පත් කරන ලදී.





2.5 ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය

ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පෙදරේරු, වඩු, විදුලි කාර්මික, ජලනල කාර්මික වැනි ක්ෂේත්‍රයන්ගේ ලත් පුහුණුව සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සේවය රාජ්‍ය අංශයේ විවිධ ආයතන වෙත හා ආගමික සිද්ධස්ථාන වෙත ලබා දෙනු ලබයි.

ඒ යටතේ 2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.

අනු අංකය	ඉදිකිරීම් ව්‍යාපෘතියේ විස්තර	යොදවා ඇති භටයින් ගණන
1	රත්තොට ප්‍රාදේශිය ලේකම්කාර්යාලයට අයත් ගම්පෙරළිය කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ සෙවිලි තහඩු භාවිතා කර ලැයිම් කාමර සෙවිලි කිරීමේ ව්‍යාපෘතිය	13
2	මිගමුව පල්ලන්සේන බන්ධනාගාරය ඉදිකිරීම	20





2.6 විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සහ අලි පලවා හැරීම

අලිමිනිස් ගැටුම් බහුලව පවතින ප්‍රදේශවල මිනිසුන්ගේ හා අලි ඇතුන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා වනජීවී අමාත්‍යාංශය හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වන අලි කළමනාකරණ ,පලවා හැරීම්, හා අලිවැට ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘතින් රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ සිවිල් ආරක්ෂක භටයන් 3856 ක් යොදවා කිලෝ මීටර් 2113 ක දිගින් යුක්ත වන විදුලි වැටවල් 201 ක් නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි.





2.7 ගුරු හිඟය පවතින දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ස්වේච්ඡා ගුරුවරුන් අනුයුක්ත කිරීම

දිවයිනේ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි ගුරුවරුන් හිඟ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කරනු වස්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සුදුසුකම් ලත් ගුරුවරුන් 183 ක් උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138 ක් වෙත අනුයුක්ත කර ඇත.

2.8 දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන වෙතින් ක්‍රියාවට නංවා ඇති කෘෂී ව්‍යාපෘති

- **වාර්ෂික බෝග**
- **කෙසෙල් වගාව**

ගස්ලබු වගාව





- බඩඉරිගු වගාව





- **වී වගාව**





- **බ්ලොක්ගල් ව්‍යාපෘතිය**





- **තංගල්ල නෙටොල්පිටිය කෘෂි ව්‍යාපෘතිය - නෙටොල්පිටිය කොක්වත්ත ප්‍රදේශයේ පිහිටි අක්කර 08ක භූමි ප්‍රමාණයෙන් අක්කර දෙකක භූමි ප්‍රමාණයක කහ වගාවත්, අක්කර 2 ½ ක බටු වගාවත්, අක්කර 2 ½ක මඤ්ඤොක්කා වගාවත් සිදු කර ඇත.**
- **කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර අලෙවි කිරීම.**



- **පොල් වගාව**





➢ කරණවැමි ව්‍යාපෘතිය - අම්පාර නගරයේ පවත්වා ගෙන යන අතර, ඒ සඳහා භටයින් 09 දෙනෙකු යොදවා ඇත.



2.9 ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම

2024 වර්ෂයේ දිවයිනේ විවිධ ප්‍රදේශ තුළ ඩෙංගු මදුරුවන් බෝවීම හා පැතිරීම හේතුවෙන් පොදු ස්ථාන හා ඩෙංගු බෝවීමේ ස්ථාන හඳුනාගෙන ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ උපදේශකත්වයෙන් විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, රට පුරා විවිධ ප්‍රදේශයන්හි පිහිටි ආයතන විසින් පවත්වන ලද ඩෙංගු මර්ධන වැඩසටහන් 123 ක් සඳහා සාමාජික/සාමාජිකාවන් 1229 ක් යොදවා ඇත.









2.10 මත් උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රට තුළ තරුණ තරුණියන් හා ළමා පරපුර මත්ද්‍රව්‍ය භාවිතයට විශාල වශයෙන් ඇබ්බැහි වීම හේතුවෙන් එය අවම කර ගැනීම හා මතින් තොර රටක් යන අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව විශේෂ පුහුණුව ලත් උපදේශකයින් යොදවා උපදේශන වැඩසටහන් 30ක් පමණ ක්‍රියාත්මක කර ඇත.





2.11 දෙපාර්තමේන්තුමය සුභසාධන ක්‍රියාකාරකම්

විශ්වමඩු,කිළිනොච්චි,මුලතිව් යන ප්‍රදේශවල සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන්ගේ පවුල්වල පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් බෙදා දීම සහ විල්පත්තුව බලකායේ මියගිය රණවිරු පවුල් සඳහා වියලි ආහාර ද්‍රව්‍ය බෙදා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.





විශ්වමඩු, කිළිනොච්චි, මුලතිව් යන ප්‍රදේශවල තෝරාගත් සිවිල් ආරක්ෂක පවුල් සඳහා නිවාස ලබාදීමේ වැඩසටහන සිදු කරන ලදී.



2.12 නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි

විහාර මහා දේවී උද්‍යානය, කාක දූපත වෙරළ උද්‍යානය, කොළඹ පාවෙන වෙළඳ සංකීරණය, මාදිවෙල ඇවිදින මංතිරුව ආදී ස්ථාන රාශියක නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි සඳහා හටයන් 250 දෙනෙකු වර්ෂය පුරා රාජකාරියෙහි අනුයුක්ත කර ඇත.

2.13 බලකා මගින් ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති

- **රෝහල් අළුත්වැඩියාව වෙනුවෙන් ශ්‍රමදායකත්වය ලබා දීම**
- **වෙහෙර විහාරස්ථාන ඉදිකිරීමට අවශ්‍ය ශ්‍රමදායකත්වය සපයාදීම**
- **මැටි භාණ්ඩ ව්‍යාපෘති/ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘති /පශු සම්පත් ව්‍යාපෘති/ඉදල් නිෂ්පාදන ව්‍යාපෘති ආදිය සිදු කිරීම**
- **කරණවෑමි ව්‍යාපෘති පවත්වා යාම**

රෝහල් අළුත්වැඩියාව වෙනුවෙන්
ශ්‍රමදායකත්වය ලබා දීම





3 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2024.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය **රු.**

අයවැය වර්තමාන වර්ෂය (2024)		සටහන	තත්‍ය රු.		
			වර්තමාන වර්ෂය 2024	ඉකුත් වර්ෂය නැවත ගළපන 2023	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ - 1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	**මුළු ආදයම් ලැබීම් (අ)**		-	-	
-	**ආදයම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		20,711,350,075	17,180,150,000	ඒසීඒ - 3
-	තැන්පතු		1,098,481,407	1,106,675,531	ඒසීඒ - 4
-	අත්තිකාරම් ගිණුම්		369,905,585	366,048,253	ඒසීඒ - 5/5(අ)
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**22,179,737,067**	**18,652,873,784**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**22,179,737,067**	**18,652,873,784**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		2,091,274,443	459,934,655	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**20,088,462,625**	**18,192,939,129**	
	අඩු කළා: වියදම		-	-	
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ -2(II)
20,734,211,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	20,646,364,222	17,792,785,871	
738,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	564,170,086	558,331,609	
55,700,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	40,755,174	44,119,205	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
21,528,211,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**21,251,289,482**	**18,395,236,685**	

	මූලධන වියදම්				
57,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	43,194,336	33,383,572	
18,925,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	11,798,552	5,577,946	
-	ප්‍රාග්ධන පැවරීම්	12	-	-	**ඒසීඒ - 2(II)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
4,000,000	හැකියා වර්ධනය	14	1,245,555	2,997,515	
172,075,000	වෙනත් මූලධන වියදම්	15	59,170,944	178,179,462	
252,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**115,409,387**	**220,138,495**	
	තැන්පතු ගෙවීම්		1,134,488,769	1,251,672,285	**ඒසීඒ 4**
	අත්තිකාරම් ගෙවීම්		292,454,785	285,305,473	**ඒසීඒ 5**
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**1,426,943,553**	**1,536,977,758**	
21,780,211,000	**මුළු වියදම එ = (ඊ+උ+ඌ)**		**22,793,642,422**	**20,152,352,938**	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**(2,705,179,797)**	**(1,959,413,808)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**(2,705,300,539) 120,742**	**(1,959,413,808)**	**ඒසීඒ-7 ඒසීඒ-3**

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ -පි

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

			තත්‍ය
	සටහන	වර්තමාන වර්ෂය **2024**	ඉකුත් වර්ෂය **2023**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසිඒ -6**	2,421,429,326	1,761,457,769
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	**ඒසිඒ -5/5(අ)**	545,296,059	622,746,859
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසිඒ -3**	-	-
මුළු වත්කම්		**2,966,725,385**	**2,384,204,628**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		496,198,495	537,762,676
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		2,421,429,326	1,761,457,769
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ -5(අ)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	**ඒසිඒ -4**	48,976,822	84,984,184
අග්‍රිම ශේෂය	**ඒසිඒ -3**	120,742	-
මුළු වගකීම්		**2,966,725,385**	**2,384,204,629**

පිටු අංක 01 සිට 32 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු ඇමුණුමේ පිටු අංක 33 සිට 65 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තරද මෙම අවසන් ගිණුමේ අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා,ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණය ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරි

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී,ආර්ඩබ්ලිව්පී(තෙවරක්),ආර්එස්පී(දෙවරක්),යූඑස්පී

එම්එස්සී(ආරක්ෂක අධ්‍යයන)කළමණාකරන,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යන),
එස්එන්ඩියූ(චීනය),පීඑස්සී
ආරක්ෂක ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

දිනය : 2025..05.

.....
ගණන් දීමේ නිලධාරි

මේජර් ජෙනරල් කේඑච්පීපී ප්‍රනාන්දු(විශ්‍රාමික)
ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

දිනය : 2025..05.

.....
ප්‍රධාන ගණකාධිකාරි

ආර්.ආර්. බුලත්සිංහල
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

දිනය : 2025..05.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය **2024**	ඉකුත් වර්ෂය නැවත ගලපන ලද **2023**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	රු.	රු.
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදයම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	3,060,564,181	2,293,347,741
අග්‍රිම ලැබීම්	20,711,350,075	17,180,150,000
අත්තිකාරම් අයකර ගැනීම්	370,381,996	362,847,395
තැන්පතු ලැබීම්	1,098,481,407	1,106,675,531
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**25,240,777,659**	**20,943,020,667**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	21,100,376,471	18,239,775,853
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	40,755,174	44,119,205
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	465,897,889	441,861,867
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,091,274,443	459,934,655
අත්තිකාරම් ගෙවීම්	292,454,785	285,518,308
තැන්පතු ගෙවීම්	1,134,488,769	1,251,672,285
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**25,125,247,531**	**20,722,882,172**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ)-(ආ)	**115,530,129**	**220,138,495**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම අත්තිකාරම් අය කර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-

<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	-	-
අත්තිකාරම් ගෙවීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	115,409,387	220,138,495
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) - (ඉ)	**(115,409,387)**	**(220,138,495)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**120,472**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	120,742	0.00
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0.00	0.00
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**120,742**	0.00

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.4.1 වාර්තා කිරීමේ පදනම

1. **<u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>**
2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. **<u>මිනුම්කරණ පදනම</u>**
මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. **<u>ආදායම් හඳුනාගැනීම</u>**
හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. **<u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>**
වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. **<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**
මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. **<u>මුදල් හා මුදල් සමාන දෑ</u>**
2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7. **<u>දෙපාර්තමේන්තු පොත් තුළ හඳුනා නොගන්නා ලද මූල්‍ය නොවන වත්කම් (ජීව විද්‍යාත්මක වත්කම්) හෙළිදරව් කිරීම</u>**
ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවීම හේතුවෙන් 2024 මූල්‍ය ප්‍රකාශය තුල මූල්‍ය නොවන වත්කම් යටතේ හඳුනා නොගන්නා ලද ජීව විද්‍යාත්මක වත්කම් ඇමුණුම x යටතේ හෙලිදරව් කර ඇත.

8. **<u>දෙපාර්තමේන්තු පොත් තුල ගිණුම්ගත නොකරන ලද මූල්‍ය නොවන වත්කම් (වෙනත් යන්ත්‍ර හා උපකරණ) හෙළිදරව් කිරීම</u>**
දෙපාර්තමේන්තුව විසින් ස්ථානීය වශයෙන් හඳුනාගෙන තක්සේරු කලද, 2024 මූල්‍ය ප්‍රකාශය තුල මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත නොකරන ලද වෙනත් යන්ත්‍ර හා උපකරණ ඇමුණුම xi යටතේ හෙලිදරව් කර ඇත.

9. **<u>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වෙනත් ශීර්ෂ වෙතුවෙන් රැස් කරන ලද ආදායම්</u>**
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ අංක 05/2024 ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව, වෙනත් දෙපාර්තමේන්තු වෙතුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද ආදායම 2024.12.31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය(ACA-F) තුල සහ ACA - 1 ආකෘතිය තුල වාර්තා කර නොමැත. එම තොරතුරු ඇමුණුම xii යටතේ හෙලිදරව් කර ඇත.

10. **<u>2024.12.31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව</u>**
රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ 03 ප්‍රකාරව 2024.12.31 දිනට පිළියෙළ කරන ලද හිඟ ආදායම් පිළිබඳ වාර්තාව ඇමුණුම xiii යටතේ අන්තර්ගතය.
* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.
* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තා කිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	අවසන් ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොළිය			23,224,571	
20.03.99.00	විකුණුම් හා ගාස්තු			2,173,717,340	
20.04.01.00	සමාජ ආරක්ෂණ දායක මුදල්			855,657,776	
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	662,081	
20.06.02.01	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වාහන)	-	-	6,062,955	
20.06.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්)	-	-	1,239,459	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	18,778,000,000	21,528,211,000	21,251,289,482	98.71%
ප්‍රාග්ධන	237,000,000	252,000,000	115,409,387	46.16%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
01	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	වැටුප් හා දීමනා ගෙවීම		93,955,390	93,955,390	100%
02	ආරක්ෂක අමාත්‍යාංශ	සයිබර් ආරක්ෂාව වෙනුවෙන් වියදම් දැරීම	5,000,000	5,000,000	4,510,602	90%
03	ශ්‍රී ලංකා දූම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් දුම්රිය බලපත්‍ර වියදම්		11,691,845	11,691,845	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	1,106,223,058	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	905,084,643		-
9153	ඉඩම්	-	346,194,000		-
9154	අස්පෘශ්‍ය වත්කම්	-			-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	60,711,700		-
9160	කෙරිගෙන යන වැඩ	-	3,216,000	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩීඊඑෆ්/ඊ/සිඑස්ඩී/2024/එෆ්ඒ් මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2025 මැයි 15 දින

අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින්, මූල්‍ය තත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

(අ) කෘෂි, සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන අංශ මගින් දෙපාර්තමේන්තුව වාර්ෂිකව ආදායම් රැස්කරන අතර, එම ආදායම් ප්‍රභවයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 2,173,717,340 ක ආදායමක් ඉපයූ බව මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 හා 2023 වර්ෂවලදී සහල් අලෙවියෙන් මැදිරිගිරිය බලකාය වෙත ලැබිය යුතු රු.575,475 ක මුදලක් සහ උහන බලකාය වෙත ලැබිය යුතු රු.1,200,000 ක මුදලක් හා මහඔය බලකාය වෙත ලැබිය යුතු රු.1,063,047 ක මුදලක් වශයෙන් ලැබිය යුතු මුළු මුදල වූ රු.2,263,047 ක් ව්‍යාපෘති අංශය විසින් හඳුනාගෙන වාර්තා කර නොතිබීම හේතුවෙන් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර තිබූ හිඟ ආදායම් වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ද රු.2,263,047 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) රු.4,500,000ක් වටිනා WPGP-8951 අංක දරන ඩබල් කැබ් රථය මූල්‍ය ප්‍රකාශන තුළ කාර් රථයක් ලෙස සහ ඩබල් කැබ් රථයක් ලෙස දෙවරක් ඇතුලත් කර තිබූ අතර ඒ අනුව එම වටිනාකම්වල දේපළ, පිරියත හා උපකරණ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතුව පැවති පාපැදි 341 කින් පාපැදි 277 ක වටිනාකම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබූ අතර පාපැදි 34 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි .

(ඇ) අයිතිය පවරාගෙන අවසන් කර තිබූ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් කැබලි 05ක තක්සේරු වටිනාකම වූ එකතුව රු.17,262,500 ක් ACA 6 තුල ඇතුලත් කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.17,262,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයිතිය පවරාගෙන තිබූ හෙක්ටයාර් 10.6313 වපසරියකින් යුත් බිම් කැබලි 20 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර නොතිබුණි.

1.6.3 මූල්‍ය වත්කම්

(අ) 2023 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් බී ගිණුමේ පැවති ණය ශේෂ 2 ක් සහ ශූන්‍ය වටිනාකම් සහිත ණය ශේෂ 3 ක් 2024 වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දැක්වීමේදී සෘණ අගයකින් වාර්තා කර තිබීම මත සමාලෝචිත වර්ෂයේ අරම්භක ශේෂ රු.531,234 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2023 වර්ෂයේ අවසාන ශේෂ ලෙස දක්වා තිබූ එකතු වටිනාකම් රු.573,213 ක ණය ශේෂ 03 ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දක්වා නොතිබීමෙන් එම වටිනාකමින් ආරම්භක ශේෂ අඩුවෙන් දක්වා තිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	හානි පිළිබඳ ලේඛනය	මු.රෙ 110	හානි පිළිබඳ ලේඛනය අදාල වටිනාකම් ඇතුලත්ව විස්තරාත්මකව පවත්වාගත යුතු වුවත් පාලන අංශය විසින් පවත්වා ගෙන යනු ලබන හානි පාඩු ලේඛනයෙහි හානියට අදාළ විස්තර සටහන් කිරීමේදී අවධිමත් ලෙස සටහන් තැබීම්, නිසි අධිකාර බලයක් රහිතව සටහන් සංශෝධන සිදුකිරීම් හා ලේඛනයට ඇතුළත් නොවූ හානි පාඩු පැවතීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.
(ආ)	ණය හා අත්තිකාරම් ලේඛනය	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05	දෙපාර්තමේන්තුව විසින් එක් එක් නිලධාරීන් වෙනුවෙන් ආරම්භක ශේෂ සහ ඒ ඒ මාසයේ අවකරණය කර ගන්නා ණය මුදල් ප්‍රමාණයන් හා පොලිය සහ දෙසැම්බර් 31 දිනට ණය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ඡේදය	මුදලේ නවදුරටත් අයවීමට ඇති ශේෂය දක්වමින් CC – 10 ණය හා අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, පරිගණක පැතුරුම්පතක් ආධාරයෙන් ණය ශේෂ හා අයකිරීම් සටහන්කර තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින්-කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.2 (අ) (i)	ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (ඇ)
1.6.2. (ඇ) (ii)	සියළුම ව්‍යාපෘති ආදායම් යාවත්කාලීනව නිවැරදිව ගිණුම්වල හඳුනාගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (ආ)
1.6.2. (ආ) (ii)	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුවීම.	1.6.2 (ආ)
1.6.2. (ආ) (iii)	තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුවීම.	1.6.2 (ඇ)
1.6.2 (ඇ)	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය.	1.6.4 (ආ)
2.1	නිහ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම.	3.1
2.2 (i)	පිළියෙල කරන ලද ඇස්තමේන්තු අනුව වියදම් හැකිතාක් කළමනාකරණය කර ගත යුතු වීම.	3.2 (අ)
2.2 (ii)	ඇස්තමේන්තු හැකි තාක් නිවැරදිව පිළියෙල කිරීමට	3.2 (ආ)

	කටයුතු කළ යුතු වීම.	
3.3 (ඇ)	ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	4.3 (ඇ),(ඉ),(ඊ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සපයනු ලැබූ ආරක්ෂක හා වෙනත් සේවාවන් ඉටුකර දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 135,854,993 ක හිඟ ආදායම් අයකර ගැනීමට පැවතුණි. ඉන් රු.13,655,053 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගැනීමට අපොහොසත්ව වර්ෂ 01 ත් 07 ත් දක්වා වූ කාල පරාසයක පැවතුණි.

3.2 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සහේතුකව පූර්වානුමාන කළ හැකි සියළුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුලත් කර ඇති බවටත් ඒවා මුදල් වර්ෂය තුල තම දෙපාර්තමේන්තුවට ඉටුකල හැකි ශක්තිය ඇති බවටත් හා ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවටත් ගණන්දීමේ නිලධාරියා වගබලාගත යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සමාලොචිත වර්ෂය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු වෙනස් කිරීමේ විචල්‍යතාවය සියයට 100 ත් සියයට 323 ත් අතර පරාසයක් දක්වා විහිදී තිබුණි.

(ආ) වැය විෂයයන් 18 ක ප්‍රතිපාදනයන්හි ඉතිරිය සියයට 12 ත් සියයට 69 ත් දක්වා වූ අතර, ඉන් වැය විෂයන් 07 ක ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු ද ඉතිරි වී තිබුණි. තවද, වැය විෂයන් 04 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වැඩි කරගැනීමෙන් පසු ඉතිරි වී තිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 ඡේදය	රජයේ වාහන සඳහා සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවන කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කරුණු අතරින්,

මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන 125 කට අදාලව සමාලෝචිත වර්ෂයේ එවැනි ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 03/2017 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 සහ 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009(I)

සියලුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නිලධරයන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු වුවත් නිලධාරීන් 800 දෙනෙකුගෙන් සමන්විත වූ හොරොව්පතාන බලකායේ නිලධරයන්ගේ පැමිණීම සහ පිටවීම සනාථ කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රයක් නොතිබූ අතර නිලධාරීන් 813 දෙනෙකුගෙන් සමන්විත වූ කටුනායක බලකායේ ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාවිරහිත වී මාස 04 ක් පැවතුණි.

(ඇ) අංක IAD/GA15/8/අමා.සංදේශ/2 දරන 2015 පෙබරවාරි 09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 03 ඡේදයේ (01) හා අනුව එම සංදේශයට අංක අමප/15/0089/610/003 දරන 2015 මාර්තු 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය

(i) ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් කටයුතු සඳහා දෙපාර්තමේන්තු ශ්‍රම බලකාය යොදා ගැනීමට නිර්දේශ කර තිබූ අතර, ඒ අනුව අනුමැතිය ලබාදී තිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව මෙම දෙපාර්තමේන්තුව විසින් ආගමික ස්ථාන ආරක්ෂක රාජකාරි කටයුතු සඳහා භටයින් 370 ක්, ආගමික ස්ථාන සුභ සාධක හා නඩත්තු කටයුතු සඳහා 1,812 ක්, ආගමික ස්ථාන රියදුරු රාජකාරි සඳහා භටයින් 202 ක් හා වෙනත් රාජකාරි කටයුතු සඳහා භටයින් 10 දෙනෙකු ඇතුලුව එකතුව 2,394 ක භට/භටවරියන් ප්‍රමාණයක් ආගමික ස්ථානවල විවිධ රාජකාරි කටයුතු සඳහා යොදවා තිබුණි. මෙම පිරිස සඳහා 2024 වර්ෂයේදී වැටුප් ලෙස රු.1,292,760,000 ක මුදලක් වැයකර තිබුණි. දීර්ඝ කාලීනව සිදුවී ඇති මෙම අනුයුක්ත කිරීම් සඳහා නීත්‍යානුකූල අනුමැතියක් නොතිබුණි.

(ii) නෛතික ප්‍රතිපාදනයක් නොමැතිව දෙපාර්තමේන්තුවේ සේවය කරන භට/ භටවරියන් 4,044 ප්‍රමාණයක් 2024/2025 මහ කන්නයේ අඳ වී ගොවිතැන් කටයුතු සඳහා

මාස 04 ක කාලයක් සඳහා මුදාහැර තිබුණි. මෙම කාලපරිච්ඡේදයට අදාලව මෙම හට/ හටවරියන්හට වැටුප් ලෙස රු.727,920,000 ක පමණ මුදලක් වැයකර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 756(6) — 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2024 වර්ෂයේ ජූනි 15 ට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2025 මාර්තු මස අවසන් වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

3.4 අවධිමත් ගනුදෙනු

(අ) දෙපාර්තමේන්තුව සතු අංක PG - 0423 දරන රථයේ ධාවන සටහන්පත්වලට අනුව 2024 ජූනි 18 දින එන්ජින් පද්ධතියේ දෝෂයක් නිසා එය අලුත්වැඩියා කිරීමට පුද්ගලික ගරාජයක් වෙත යොමුකර තිබුණි. එම ගරාජයේදී රථයේ එන්ජින් පද්ධතිය ගලවා ඇති බවත්, එම හේතුව නිසා රථයේ අලුත්වැඩියාවේ නියම තත්ත්වය පිළිබඳව ලිඛිත ප්‍රකාශයක් කල නොහැකි බව දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරි විසින් 2025 මාර්තු 05 දින විගණන කටයුතු සඳහා ලිඛිතව සනාථ කර තිබුණි. මෙයට අමතරව පෞද්ගලික ආයතනයකින් ලබාදුන් තාක්ෂණික වාර්තාව අනුවද එය වැඩිදුරටත් සනාථ කර තිබුණි. ඒ අනුව විධිමත් අවසරයකින් හා තාක්ෂණික නිලධාරියෙකුගේ අධීක්ෂණයකින් තොරව දෙපාර්තමේන්තුවට අයත් මෙම රථය පුද්ගලික ගරාජයක් වෙත යොමු කර රථයේ කොටස් ගැලවීම, වෙනස් කිරීම් සිදුකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) PG – 0425 වැන් රථයේ එන්ජින් පද්ධතියේ අලුත්වැඩියාවක් 2023 දෙසැම්බර් මස සිදුකිරීමෙන් පසු, කි.මී.1896 ක් පමණක් ධාවනය කර තිබියදී එන්ජින් පද්ධතිය මුළුමනින්ම හානියට පත්වීම මත 2024 අගෝස්තු මස ධාවනයෙන් ඉවත් කර තිබුණි.පළමු අළුත්වැඩියාවේදී යොදන ලද අමතර කොටස් පිළිබඳ කිසිදු පරීක්ෂාවක් සිදුව නොතිබූ අතර එම කොටස් හානියට පත්වීම මත නැවත එන්ජින් පද්ධතිය අළුත්වැඩියා කිරීමට සිදුව තිබුණි.නැවත අළුත්වැඩියාව සඳහා රු.1,711,315 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් ඉදිරිපත් කර තිබුණි. මෙම තත්ත්වය වගකිව යුතු නිලධාරීන්ගේ නොසැලකිලිමත්භාවය හේතු කරගෙන රජයට සිදු වූ පාඩුවක් ලෙස විගණනයේදී නිරීක්ෂණය වූ අතර මෙම රථයට සිදුවුනු හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව සිද්ධිය සිදු වී දින 07 ක් ඇතුලත ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, 104 (4) ප්‍රකාරව අලාභහානිය වී මාස 03 ක් ඇතුලත ඒ සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයින් නිශ්චය කර පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත්, 2025 මාර්තු 14 දින වන විටත් එලෙස කටයුතු කර නොතිබුණි.

(ඇ) 2024 ජූලි 19 දිනැති සිඅදෙ/ආර්ජේඩී/ප්‍රවා/තාගො/01(08) මණ්ඩල වාර්තාව අනුව අංක 65 – 4873 දරන රථය නිවැරදිව අදාළ අලුත්වැඩියා කර ඇති බවට සඳහන් කර තිබූ අතර, එය පදනම් කරගෙන රු.2,159,975 ක මුදලක් 2024 ඔක්තෝබර් 14 දින ගෙවා තිබුණි. ඉහත මණ්ඩල වාර්තාව පදනම් කරගෙන රථයේ අලුත්වැඩියාවට අදාළ බිල්පත් පියවා තිබියදී නැවත මෙම රථයේ දෝෂ සහිත තත්ත්වයක් මත 2024 නොවැම්බර් 14 දින ගරාජය වෙත යොමු කර තිබුණි. ඒ අනුව රථය නියමිත පරිදි අලුත්වැඩියා කර ඇති බවට පරීක්ෂා නොකර ඉදිරිපත් කරන ලද අසම්පූර්ණ මණ්ඩල වාර්තාව නිසා රු.2,159,975 ක මුදලක් නුන්වන පාර්ශවයකට අවහාවිත කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා දී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) අංක GD – 7248 දරන නිශාන් පෙට්‍රල් ජීප් රථය 2023 අප්‍රේල් 09 වන දින රථයේ එන්ජිම ක්‍රියාවිරහිත වීමට අදාලව 2023 මැයි 31 දින කටුබැද්ද ඩිපෝවේ කළමණාකාර ඉන්ජිනේරුවරයාගෙන් ලබාගත් වාර්තාව අනුව සිසිලන පද්ධතියට අදාල රේඩියේටරයේ වතුර නිසි ආකාරව ක්‍රියා නොකිරීමත්, උෂ්ණත්ව මීටරය ක්‍රියා නොකිරීමත්, යන කරුණු මත උෂ්ණත්වය ඉහල ගොස් මෙම ආපදාව සිදුවී ඇති බව සඳහන් කර තිබුණි. රිය ධාවනය ආරම්භ කරන අවස්ථාවේ එන්ජිමේ උෂ්ණත්ව මාපකය ක්‍රියාව තිබුණේ නම් අදාල වාහනය ධාවනයේ යෙදවීම වරදක් වන අතර, ගමන අතර තුරදී උෂ්ණත්ව මාපකය කැඩී ගියේ නම් එය නොසලකා හැර රථය ධාවනය කිරීම රියදුරුගේ වරදක් බව නිරීක්ෂණය වේ. මෙම රථය 2023 අප්‍රේල් 09 දින ආපදාවට ලක් වී තිබූ අතර, එම අලුත් වැඩියාව ආරම්භ කිරීමට මාස 08 කට අධික කාලයක් ගත වී තිබුණි. ඉහත තාක්ෂණික නිලධාරියාගේ වාර්තාව අනුව එන්ජිම සම්පූර්ණයෙන් අලුත් වැඩියා කිරීමට නිර්දේශ කර තිබියදී ඉහත මාස 08 ක කාලය තුල රථය කි.මී. 693 ක ප්‍රමාණයක් ධාවනය කර ඇති අතර, ඒ සඳහා ඉන්ධන ලීටර් 244 ක ප්‍රමාණයක් වැයකර තිබුණි.මෙය ප්‍රවාහන අංශයේ වගකීමකින් තොර ක්‍රියාවක් බව විගණනයේදී නිරීක්ෂණය විය. අදාල ජීප් රථයට සිදුවූ හානිය අලුත් වැඩියා කිරීමට රු.997,300 ක මුදලක් වැය කර තිබූ අතර මෙලෙස අපරීක්ෂාකාරී ලෙස රිය ධාවනය කිරීම නිසා රථයට සිදුවූ පාඩුව අදාල රියදුරුගෙන් හෝ ඒ සඳහා වගකිව යුතු වෙනත් නිලධාරීන් සිටිනම් එම නිලධාරීන්ගෙන් අයකර ගත යුතු නමුත් විගණිත දින වූ 2025 පෙබරවාරි 18 වන තෙක් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව විසින් මිය ගිය නිලධාරීන් 30 කට හා විශ්‍රාම ගිය නිලධාරීන් 24 කට වැඩිපුර ගෙවා තිබූ වැටුප් රු.626,027 ක් හා එම කාලය තුලදී සේවය හැර ගිය නිලධාරීන් 45 කට වැඩිපුර ගෙවා තිබූ රු.1,281,196 ක් වූ වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගෙන නොතිබුණි.

3.5 නත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 මඟින් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371(5) අනුව කිසියම් විශේෂිත කාර්යයකට ලබාදුන් අතුරු අග්‍රිමයක් එම කාර්ය නිමකල විගසම හෝ අදාල කාර්යය නිම කර දින 10 ක් ඇතුලත නැවත පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් 31 දක්වා අවස්ථා 41 කදී ලබාදී තිබූ එකතුව රු.1,622,334 ක් වූ අත්තිකාරම් දින 14 සිට දින 346 දක්වා වූ ප්‍රමාදයකින් යුක්තව පියවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 30 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වෙත රු.75,000 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබියදී එය පියවීමට පෙර නැවතත් පෙබරවාරි 02 දින එම නිලධාරියාටම රු.100,000 ක මුදලක් අත්තිකාරම් ලෙස ලබා දී තිබූ අතර එම අත්තිකාරම් දෙකම සමාලෝචිත වර්ෂයේ මාර්තු 05 දින පියවා තිබුණි. ඒ අනුව එම නිලධාරියා අත එම කාලපරිච්ඡේදය තුල මුදල් රෙගුලාසි වලට පටහැනිව රු.175,000 ක අත්තිකාරම් ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

3.6 තැන්පතු

පොදු තැන්පතු ගිණුම් අංක 6000-0-0-18-0-17 දරන ගිණුමේ 2022 වර්ෂයේ අවස්ථා 12 කදී ලද රු.189,643 ක මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී වසර 2 ඉක්මවා තිබුණි.

3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් 03 කට අදාලව අවස්ථා 60 කදී බැර වී තිබූ එකතුව රු.3,579,877 ක මුදලක් මාස 01 සිට 11 දක්වා වූ කාලපරාසයකින් යුතුව පැවතියද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 වර්ෂය සඳහා පිළියෙල කරන ලද කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ "අංක 1462/20 හා 2006.09.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අමප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් රජය විසින් පවරා ඇති අමතර කාර්යයන් ලෙස දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පලතුරු ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මඟින් රටේ ජාතික ආහාර නිෂ්පාදන ශක්තිමත් කිරීම, අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම, ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම සහ උතුරු සහ උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරණ යන්ත්‍ර ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම" දක්වා තිබුණ ද, උක්ත ගැසට් පත්‍රය සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව තුල එම කාර්යයන් ඇතුලත්ව නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) අංක 63 – 4945 දරන බස් රථය අලුත්වැඩියාවට අදාළව ඇස්තමේන්තු පිළියෙල කිරීම හා මිළ ගණන් ඉදිරිපත්වීම විශ්ලේෂණාත්මකව බැලූ විට ෂීට් කවර දැමීම හා අලුත්වැඩියා කිරීම මෙම ප්‍රසම්පාදනයේ විශේෂිත කරුණක් වන අතර, එම කාර්යය ඒ සඳහා විශේෂිත වූ ආයතන වලින් කරගත යුතු කාර්යයක් බව විගණනයේදී නිරීක්ෂණය විය. එමෙන්ම මෙම ෂීට් කවර වලට අදාළ පාට, කල්පැවැත්ම, ගුණත්වය හා භාවිතා කරන රෙක්සින්වල සනත්වය ආදිය හා එම කාර්යයට අදාල අනෙකුත් සාධක ඇතුලත් කර පිරිවිතර පිළියෙල කිරීම සිදුකර එයට ගැලපෙන පරිදි මිල ගණන් කැඳවා ඇගයීම් සිදුකර රජයට උපරිම වාසිදායක ලෙස එම කාර්යය සිදුකර ගත යුතු වුවත් එය නොසලකා හැර කටයුතුකර තිබුණි. තවද මෙම ෂීට් කවර මැසීමට භාවිතා කරන රෙක්සින් සාම්පල් පරීක්ෂා කිරීමෙන් හෝ අදාල සාම්පල් ගොනුගත කිරීමට හෝ මෙම කාර්යය සම්බන්ධයෙන් කටයුතු කරන ලද තාක්ෂණික කමිටුව කටයුතු කර නොතිබුණි.

(ආ) ලිපි ගොනු අංක CSD/LOG/F/6/24 යටතේ රු.1,964,409 ක් වැය කරමින් 2024 වර්ෂයේ මෙට්ට 190 ක් මිලදී ගෙන තිබුණි. ඒ සඳහා 2024 ජනවාරි 17 දින තාක්ෂණික ඇඟයීම් කමිටුව පත්කර 6x3x4 ප්‍රමාණයේ ඩබල් ලේයර් මෙට්ට 220 ක් මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතරයන් සහ අවශ්‍යතා හඳුනාගෙන 2022 ජනවාරි 22 දිනට

පෙර ඉදිරිපත් කිරීමට පවරා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 2.4.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටුවල සේවය කරන සියළුම සාමාජිකයින් තමන්ගේ එදිනෙදා කටයුතුවලට වඩා ප්‍රසම්පාදන කමිටුවේ/ තාක්ෂණික ඇගයීම් කමිටුවේ තමන්ට පවරා ඇති කාර්යභාරයට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. කෙසේ නමුත් පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව නියමිත දිනට පිරිවිතර ලබාදී නොතිබීම හේතුවෙන් නැවතත් 2024 පෙබරවාරි 09 දින CSD/LOG/F/6/24 දරන ලිපිය මඟින් ඉහත සඳහන් වාර්තාව ලබා දෙන ලෙස ඉල්ලීමට අධ්‍යක්ෂ (ප්‍රසම්පාදනය) ට සිදු වී තිබුණි. තවද , තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉහත ප්‍රසම්පාදනය සඳහා 2024 අගෝස්තු 12 දින තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබා දී තිබූ නමුත් එම වාර්තාවෙහි ප්‍රසම්පාදන අත්පොතෙහි 7.11.1 හි "ලංසු ඇගයීමේ වාර්තාව" අනුව සියලු ලංසුකරුවන්ට, තාක්ෂණික පිරිවිතරයන්ගේ ප්‍රධාන ප්‍රතිපාදනවලට ලංසුකරුවන්ගේ අනුකූලතාවය පෙන්නුම් කරන වගුවක් ලංසු ඇගයීමේ වාර්තාව තුල ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ලිපි ගොනු අංක CSD/LOG/KIT/59/2023 යටතේ රු.12, 282,200 ක් වැය කරමින් කොළ පැහැති මේස් කුට්ටම් 20,000 ක් මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන අත්පොතෙහි 5.3.2 අනුව සියලු අයුරින් සුදුසුකම් ලද විභව ලංසුකරුවන්ට උපරිම තරහකාරීත්වයක් සලසා දීම සඳහා ඉතා සාධාරණ අවස්ථාවක් සලසා දීමට හැකිවන අයුරින් ලංසු කැඳවීමේ ආරාධනයක් සමන්විත විය යුතු නමුත් දෙපාර්තමේන්තුව විසින් ලංසු ආරාධනයේ මේස් (කොළ පාට) ජෝඩු 35,000 ක් සඳහා මිල ගණන් කැඳවා තිබුණද, මේස් ජෝඩු 20,000 ක් පමණක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනය ආරම්භයේදී අවශ්‍යතාවය පිළිබඳ නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද, 2023 නොවැම්බර් 16 දින ලබාදුන් නිර්දේශ සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ එක් සාමාජිකයෙකු එම තීරණයට එකඟවේද, නොවේද යන්න දක්වා නොතිබීම, සැපයුම්කරුවන් දෙදෙනෙකු මුදල් ගෙවීමෙන් පසු පරීක්ෂාව සඳහා ආදර්ශක ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ලබාදීමට මාස 03 කට අධික කාලයක් ගෙන තිබීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4 ප්‍රකාරව ලංසු ඇගයීම් හැකිතාක් ඉක්මණින් සිදුකළ යුතු වුවද 2023 අප්‍රේල් 04 දින ලංසු විවෘත කිරීමෙන් පසු තාක්ෂණික කමිටුව 2023 ඔක්තෝබර් 23 දින තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබාදුන් දිනය දක්වා සති 26 කට අධික කාලයක් ගත කර තිබූ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්තාව ලැබීමෙන් පසුවද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබා දීමට ද එම කමිටුව විසින් සති 05 කට අධික කාලයක් ගෙන තිබීම හා ප්‍රසම්පාදන කමිටුව විසින් 2023

දෙසැම්බර් 08 දින රු.11,970,000 ක මිලකට මිලදී ගැනීමට තීරණය කරන අවස්ථාව වන විට එකතු කළ අගය මත බදු ප්‍රතිශතය සියයට 18 දක්වා ඉහළ ගොස් තිබීම හේතුවෙන් රු.312,261 ක මුදලක් එකතු කළ අගය මත බදු ලෙස වැඩිපුර ගෙවා මිලදී ගැනීමට ද සිදු වී තිබුණි.

(ඇ) CSD/LOG/B/346/2023 යටතේ වෙන්නවත්ත බලකායේ ගොඩනැල්ල අළුත්වැඩියා කිරීම සඳහා රු.1,094,779 ක මුදලක් වැය කර තිබූ නමුත් එම ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයට අනුව තාක්ෂණ ඇගයීම් කමිටුවේ එක් එක් සාමාජිකයා තමාට පැවරී ඇති පුද්ගලික වගකීම් භාරය තහවුරු කිරීම පිණිස වෙන් වෙන්ව අත්සන් තැබිය යුතු වුවත් 2023 දෙසැම්බර් 01 දින අයිතමයන් 04 ක මිල ගණන් සඳහා නව මිල ගණන් කැඳවා ගැනීමෙන් පසු ලබා දුන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ එක් සාමාජිකයෙකු විසින් අත්සන් තබා නොතිබුණි. තවද, 2024 ජනවාරි 11 දින ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ප්‍රසම්පාදනය සඳහා තීරණය ලබාදී තිබුණ ද, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු එම ප්‍රසම්පාදනය සඳහා එකඟ වේ ද නොවේ ද යන්න සඳහන් කර නොතිබුණි. ඒ අනුව නිසි අනුමැතීන් නොමැති ප්‍රසම්පාදනයක් සඳහා ඉහත සඳහන් කරන ලද මුදල ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

4.3 වත්කම් කළමනාකරණය

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව වාහන හා උපකරණ 574 ක් පැවති අතර ප්‍රවාහන අංශය විසින් ලබාදුන් වාහන උපලේඛන අනුව දෙපාර්තමේන්තුව සතුව වාහන හා උපකරණ 544 ක් පමණක් පැවතුණි. ඒ අනුව වාහන හා උපකරණ 32 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර තිබූ රු.28,058,975 ක් වටිනා වාහන 60 ක් ප්‍රවාහන අංශයෙන් ලබාදී තිබූ උපලේඛන තුල ඇතුලත්ව නොතිබූ අතර ප්‍රවාහන අංශයේ උපලේඛන අනුව පැවති වාහන 17 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රවාහන අංශය හා ගිණුම් අංශ යන අංශ දෙකෙහිම වාර්තා තුල ඇතුලත් නොවූ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන 16 ක් පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ දැනට භාවිතා කරන වාහන 27 ක සහ අපහරණය සඳහා යෝජනා කර ඇති වාහන 25 ක නීත්‍යානුකූල නිමිකාරත්වය දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(ඈ) ගිණුම් අංශය විසින් රු. 69,310,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 6 ක පිහිටා ඇති

අක්කර 176 රූඩ් 3 පර්චස් 39.5 ක් ගිණුම් තුල පැවති නමුත් දෙපාර්තමේන්තුව සතුව එවන් ඉඩම් කැබලි 6 ක් නොමැති බව පාලන අංශය ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

(ඉ) ගිණුම් අංශය විසින් රු. 198,846,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 4 ක පිහිටා තිබූ ඉඩම් කැබලි 4 ක ප්‍රමාණය අක්කර 121 රූඩ් 2 පර්චස් 33.12 ක් ලෙස දක්වා තිබූ නමුත් පාලන අංශය විසින් ලබා දී තොරතුරු අනුව එම ඉඩම් කැබලි වල මුළු භූමි ප්‍රමාණය අක්කර 33 රූඩ් 2 පර්චස් 35.48 ක් වූ අතර ඒ අනුව අක්කර 88 කින් පමණ භූමි ප්‍රමාණයේ වෙනසක් අංශ දෙකෙහි වාර්තා අතර පැවතුණි.

(ඊ) ශ්‍රී පුර උප බලකාය පිහිටි භූමිය ගිණුම් අංශය විසින් පලුගස්වංගුව, සිරිපුර නමින් රූඩ් 1 පර්චස් 28.4 ක ඉඩමක් රු.513,000 කට ගිණුම්ගත කර තිබූ නමුත් පාලන අංශයේ ලබාදුන් තොරතුරු අනුව ශ්‍රී පුර උප බලකායේ ඉහත භූමි ප්‍රමාණය දක්වා නොතිබුණි.

(උ) දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට දිවයිනේ විවිධ ප්‍රදේශවල පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 563 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් බිම් කැබලි 32 කට අදාළ හෙක්ටයාර් 19.1421 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර, ඉතිරි බිම් කැබලි 531 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගැනීම් කටයුතු අවසන්කර නොතිබුණි.

4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 සහ 891 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 07 කට හා ද්විතියික තනතුරු 02 කට අදාළ නිලධාරීන් 73 දෙනෙකුට අදාළ ඇප මුදල් තබා නොතිබුණි.

4.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) යුධ හමුදාවේ නිලධාරීන් දෙදෙනෙකුට, යුධ හමුදාවෙන් ඉන්ධන හා රියදුරු සමඟ වාහන ලබාදී තිබියදී දෙපාර්තමේන්තුව විසින්ද ඉන්ධන හා රියදුරු සමඟ වාහන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට පටහැනිව නීත්‍යානුකූල නොවන ලෙස ලබා දීම නිසා 2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා මාස 03 තුලදී පමණක් රු.287,473ක් හා රු.913,767 ක් වශයෙන් එම නිලධාරීන් දෙදෙනා වෙනුවෙන් වැයකර තිබුණි.

(ආ) නීතිමය ප්‍රතිපාදන නොතිබියදී එක් නිලධාරියෙක් ගාල්ල ප්‍රදේශයේ නිවසට යාමට ගමන්වාර 27 ක් සඳහා රු.115,875 ක් වටිනා ඉන්ධන ලීටර් 375 ක් වැයකර තිබුණි.

එමෙන්ම එක් රථයක ධාවන සටහන් පරීක්ෂාවේදී එහි සඳහන් ස්ථාන වෙත නිලධාරියා ගමන්කර ඇති බවට විගණනයට නහවුරු නොවිය.

4.6 පාඩු හා හානි

(අ) මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක්ද, මුදල් රෙගුලාසි 104 (4) අනුව අලාභහානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත දී පූර්ණ වාර්තාවක්ද ඉදිරිපත් කල යුතු වුවත් දෙපාර්තමේන්තුවේ සිදු වී තිබූ හානි හා පාඩු සිද්ධීන් 56 කට අදාල වාර්තා හා නිර්දේශයන් දින 60 ත් වර්ෂ 04 ත් අතර කාල පරාසයන් තුල ප්‍රමාද වී තිබුණි.

(ආ) හානි හා පාඩු සිද්ධීන් 10 කට අදාළව මණ්ඩල චාර්තා අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් රු.6,295,433 ක් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) වැලිසර විශේෂ ව්‍යාපෘතිය මඟින් පවත්වා ගෙන ගිය පිටත බලකා වෙතින් වාර්තා කරන ලද හට පිරිස් සඳහා ආහාර ලබාදීමේ ක්‍රියාවලිය හා බලකා මඟින් නිෂ්පාදනය කරනු ලබන සහල්/ ධාන්‍ය අලෙවි කිරීමේ ක්‍රියාවලියේදී සිදු වූ විෂමතාව සම්බන්ධව කිසිදු සටහනක් හානි පාඩු ලේඛනයේ හෝ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම ii හි ඇතුලත් කර නොතිබූ අතර එම මූල්‍ය අක්‍රමිකතාවය සිදුකල නිලධාරියාගෙන් රු.20,795,972 ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත අයකරගත යුතු නමුත් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

4.7 කළමනාකරණ දුර්වලතා

(අ) කටුනායක බලකායට අනුයුක්ත හටයින් 61 දෙනෙකු ආගමික ස්ථාන 25 ක ඉදිකිරීම්, සුබ සාධක, රියදුරු සහ ආරක්ෂක කටයුතු වෙනුවෙන් යොදවා තිබුණි. ඉන් ආගමික ස්ථාන 12 ක් සඳහා වසර 11 කට අධික කාලයක සිට හටයින් 30 දෙනෙකු ලිඛිත අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි. තවද, ලිඛිත අනුමැතියකින් 2018 වර්ෂයේ සිට ආගමික ස්ථාන සඳහා යොදවා තිබූ හටයින් 10 දෙනෙකු නිශ්චිත කාලසීමාවක් සඳහන් කර නොතිබුණි.

(ආ) විල්පත්තු බලකායේ හට පිරිස් අතුරින් හටයින් 129 දෙනෙකු ආගමික ස්ථාන 58 ක් සඳහා පෙදරේරු කාර්මික, ජලනල කාර්මික, රියදුරු, ආරක්ෂක, ඉදිකිරීම් සහ සුභසාධන රාජකාරී සඳහා යොදවා තිබුණි. ඉන් ආගමික ස්ථාන 11 ක් සඳහා හටයින්

16 ක් යෙදවීමට පමණක් ලිඛිත අනුමැතීන් ලබාදී තිබූ අතර එම භටයින් යොදවන කාල සීමාවක් දක්වා නොතිබීම මත මාස 04 සිට වර්ෂ 05 ත් අතර කාල පරාසයක සිට එම ස්ථානවල රාජකාරී කර තිබුණි. තවද, ලිඛිත අනුමැතියකින් තොරව ආගමික ස්ථාන 47 ක් සඳහා 2015 වර්ෂයේ සිට භටයින් 113 දෙනෙකු යොදවා තිබුණි.

(ඇ) හොරොව්පොතාන බලකා භූමිය තුළ කළුවර, බුරුත, වීර, කෝං, වෙළං ආදී ගස් 500 කට අධික ප්‍රමාණයක් පැවති අතර එම ගස් අංක කර ලේඛන ගත කර ගිණුම් වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2006 සැප්තැම්බර් 13 දිනැති අංක 1462/20 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අමප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් රජය විසින් පවරා ඇති අමතර කාර්යයන්වලට පටහැනිව දෙපාර්තමේන්තුවට පවරා ඇති රාජකාරී තුල නෙමැති වූ පාසල් ගුරු රාජකාරී සඳහා හොරොව්පතාන බලකායේ භටයන් 5 දෙනෙකු, කැබිතිගොල්ලෑව බලකායේ භටයන් 26 දෙනෙකු සහ විල්පත්තු බලකායේ භටයින් 18 දෙනෙකු යොදවා තිබුණි.

(ඉ) කැබිතිගොල්ලෑව බලකායේ භටයන් අතරින් ආගමික ස්ථාන සඳහා භටයින් 79 දෙනෙකු ඉදිකිරීම්, සුභ සාධක සහ ආරක්ෂක රාජකාරී සඳහා සේවයේ යොදවා තිබුණි. මෙම සියළු අනුයුක්ත කිරීමක් සඳහාම ලබාදී තිබූ අනුමැතීන් නිශ්චිත කාල සීමාවක් නොදක්වමින් ලබාදී තිබූ අතර, ඉන් එක් ස්ථානයක සුභ සාධන කටයුතු සඳහා 2007 සැප්තැම්බර් 23 දින සිට භටයින් තිදෙනෙකු අනුයුක්ත කර තිබූ අතර 2024 නොවැම්බර් 27 දක්වා වසර 17 කට අධික කාලයක් එකම ස්ථානයක සේවයේ යොදවා තිබුණි. තවද, බලකා ප්‍රදේශයේ පිහිටි ස්ථාන 16 ක සේවය කළ භටයින් ගණන 32 ක් වූ අතර, ඉන් එක් ස්ථානයක පමණක් යෙදවූ භටයින් මාසිකව මාරුකර තිබූ අතර අනෙකුත් ස්ථාන 15 හි භටයින් වසර 01 ත් 17 ත් අතර කාලයක සිට එකම ස්ථානයේ සේවයේ යොදවා තිබුණි.

(ඊ) කැබිතිගොල්ලෑව බලකාය විසින් 2022 සහ 2023 වර්ෂ වලදී සුදු කැකුළු, කුරක්කන්, කව්පි, කෙසෙල්, අමු මිරිස්, කුරක්කන් පිටි, බණ්ඩක්කා, අමු මිරිස් මඤ්ඤොක්කා, වියලි මිරිස් යන අස්වනු කි.ග්‍රෑම් 1,020.6 ක්, ඉදල් 1,815 ක් සහ පොල් ගෙඩි 932 ක් සේවා වනිතා ඒකකයට ලබාදී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ සඳහා මුදල් ගෙවා නොතිබුණි.

(උ) අත්තිකාරම් ගිණුම් තුල මියගිය නිලධාරීන් 215 දෙනෙකුගෙන් අයවිය යුතු රු.7,760,450 ක ණය ශේෂ පැවති අතර, ඒ තුල නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 5 ත් 10 ත් අතර පැරණි රු.1,361,027 ක ණය ශේෂ සහ නිලධාරීන් 4

දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 3 ත් 5 ත් අතර පැරණි රු.384,630 ක ණය ශේෂ ඇතුලත් වී තිබුණි.

(ඌ) අත්තිකාරම් ගිණුම් තුල විශ්‍රාම ගිය නිලධාරීන් 159 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,395,184 ක් වටිනා ණය ශේෂ පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.237,799 ක් වසර 3 ත් 10 ත් අතර පැරණි ණය ශේෂ සහ නිලධාරීන් 74 දෙනෙකුගෙන් අය විය යුතු රු.1,794,470 ක් වසර 1 ත් 03 ත් අතර පැරණි ණය ශේෂ විය.

(එ) වැඩ තහනම් කරන ලද නිලධාරීන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,569,229 ක් වටිනා ණය ශේෂ පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු රු.460,460 ක් වටිනා වසර 3 ත් 10 ත් අතර පැරණි ණය ශේෂ සහ නිලධාරීන් 29 දෙනෙකුගෙන් අය විය යුතු රු.547,247 ක් වටිනා වසර 1 ත් 03 ත් අතර පැරණි ණය ශේෂ ද පැවතුණි.

(ඒ) සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 566 දෙනෙකුගෙන් අයවිය යුතු රු.27,662,877 ක් වටිනා ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයකර ගැනීමට පැවති අතර, එම ණය ශේෂ තුල නිලධාරීන් 30 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 5 ත් 10 ත් අතර පැරණි රු.4,188,543 ක ණය ශේෂ සහ නිලධාරීන් 43 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 3 ත් 5 ත් අතර පැරණි රු.5,707,821 ක ණය ශේෂ පැවතුණි.

(ඔ) කැබිතිගොල්ලෑව බලකායේ ක්‍රියාත්මක හරිතාගාර මිරිස් ව්‍යාපෘතිය සඳහා 2021 සහ 2022 වර්ෂයන්වලදී බලකාය වෙත ලැබී තිබූ වටිනාකම රු.3,267,557 ක් වූ තොග අයිතම 19 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි තොග අයිතම 22 ක් වර්ෂ 02 ත් 03 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

එච්.පී.ඩී.ගුණසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.) වෙනුවට

එච්.පී.ඩී. ගුණසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

4 කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉදිරි ව්‍යාපෘති හා සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම.		√	
තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ප්‍රකාශිත ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම		√	
දෙපාර්තමේන්තු පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම	√		
මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව)		√	
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු කෘෂි, පශු හා විවිධ නිෂ්පාදන ව්‍යාපෘතීන්හි අපේක්ෂිත නිෂ්පාදන / අස්වනු ඉලක්ක සපුරා ගැනීම හා අපේක්ෂිත ආදායම මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම.		√	
විවිධ ඉදිකිරීම්, සිද්ධස්ථාන හා පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂක නඩත්තු, සංරක්ෂණ, නගර අලංකරණ ආදී වශයෙන් පැවරෙන ව්‍යාපෘතීන් නිසි පරිදි ඉටුකිරීම.		√	

5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්කය / දර්ශකය	2023 භෞතික ප්‍රගතිය	2024 වර්ෂයේ ජයග්‍රහණලබා ගැනීමේ ප්‍රතිශතය		
				0%-49%	50%-74%	75%-100%
1	2	3	4	5		
2.C **සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම**	1. විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදු කිරීම	i. වාර්ෂිකව වී, එළවළු, බඩඉරිඟු, කජු, දේශීය අඹ, විවිධ ධාන්‍ය, කුළු බඩු වගා කිරීම. කිරි, බිත්තර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන කිරීම	a.වගාකළ අක්කර ගණන/බෝග වශයෙන් වී/අඳ වී - අක්කර 7,416.75 බඩඉරිඟු - අක්කර 498 කවුපි - අක්කර 218 කුරක්කන් - අක්කර 236 උඳු - අක්කර 291.5 තල - අක්කර 297 රටකජු - අක්කර 302.5 ස්ථීර බෝග - අක්කර 4717.5 මිරිස් - අක්කර 33.5 වෙනත් බෝග - අක්කර 183 වාර්ෂික බෝග - අක්කර 693.25 b.ඵලදාව කිලෝ ගණන/බෝග වශයෙන් වී - කි.ග්‍රෑ 6,089,524 බඩඉරිඟු - කි.ග්‍රෑ 146,408 කජු - කි.ග්‍රෑ 57,793 කවුපි - කි.ග්‍රෑ 7,911 කුරක්කන් - කි.ග්‍රෑ 49,065 උඳු - කි.ග්‍රෑ 44,974 තල - කි.ග්‍රෑ 46,879 මුං ඇට - කි.ග්‍රෑ 3,038 රටකජු (අමු) - කි.ග්‍රෑ 2,377 රටකජු (වියලි) - කි.ග්‍රෑ 67,741 වෙනත් භෝග - කි.ග්‍රෑ 3,529 මිරිස් - කි.ග්‍රෑ 99,581 වට්ටක්කා - කි.ග්‍රෑ 11,633 වෙනත් - කි.ග්‍රෑ 82,861			✓

3.5 **හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාර ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම**	7. මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක වීම වැළැක්වීම	ii. වාර්ෂිකව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 30 ක් දිවයින පුරා පිහිටා ඇති සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු බලකා විසින් පවත්වා ඇත.			✓
4.1. **2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන පරිදි සියලු ගැහැණු හා පිරිමි ළමයින් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික හා ද්විතීයක අධ්‍යාපනයක් සම්පූර්ණකර සිටින බව තහවුරු කිරීම**	7. දිවයිනේ ගුරුවරුන් හිඟ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පාසල් වල ගුරුවරුන් ලෙස දැනුම හා නිපුණතාව ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන් අනුයුක්ත කරවීම.	V. 2025 වන විට ගුරු හිඟතා ඇති දිවයිනේ සියළුම පාසල් වෙත අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාව මත නිසි පුහුණුව හා නිපුණැති ගුරුවරුන් අනුයුක්ත කරවීම සහ එමඟින් සෑම දරුවකුටම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම.	මේ යටතේ පාසල් විශේෂයෙන්ම උතුරු, උතුරුමැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138 ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 183 ක් අනුයුක්ත කර ඇත.	✓	
	8. සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය තුළ පෙර පාසල් දරුවන් සඳහා දිවා සුරැකුම් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම	Vi. 2025 වන විට සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය 750 දක්වා තවදුරටත් ව්‍යාප්ත කර තවත් දරුවන් 5000කට පමණ පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන පහසුකම් ලබාදීම.	මේ යටතේ පෙරපාසල් හා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන 553ක් ක්‍රියාත්මක කර ඇත. ඒ මඟින් දරුවන් 12,793ක් වෙත අධ්‍යාපනය හා රැකවරණය ලබා දී ඇති අතර, ඒ සඳහා ගුරුවරු ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 1,150ක් අනුයුක්ත කර ඇත.		✓
	9. සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන්ගේ පාසල් යන වයසේ සෑම දරුවකුටම අවශ්‍ය අභ්‍යාස පොත් කට්ටලයක් බැගින් වාර්ෂිකව ලබාදීම.	Viii. 2025 වන විට සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන්ගේ හා ආශ්‍රිත අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් ලබාදීම.	සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයන්ගේ පාසල් යන දරුවන් 32000 කට නව වසරට අවශ්‍ය පාසල් පොත් 136,998ක් බෙදා දී ඇත.		✓

<table>
<tr>
<td>6 b.
ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගීත්වය, දිරිගැන්වීම සහ සහාය ලබා දීම</td>
<td>1.
දිවයින පුරා ගොඩ වූ වැව් නැවත සැකසීම සහ අපවිත්‍ර වූ වැව් පිරිසිදු කර පිළිසකර කිරීම සඳහා අදාළ ආයතන සමඟ කටයුතු කිරීම.</td>
<td>i.
ගොඩ වූ හා අපවිත්‍ර වූ වැව් මහජන පරිභෝජනයට සුදුසු වන පරිදි සහ කෘෂිකර්මාන්තයට යොදා ගත හැකි ලෙස පිළිසකර කිරීම.</td>
<td>2024 වර්ෂයේදී වැව් පිළිසකර කර නැත.
එසේ නමුත් වකුගඩු රෝගය බහුලව පැතිර යන ප්‍රදේශයන්හි පහත දක්වා ඇති ආයතන මඟින් ස්ථාපනය කර ඇති ජල පෙරණ යන්ත්‍ර 417 ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයන් 573 දෙනෙකු යොදවා දිවා රාත්‍රී පිරිපහදු ජලය ලබා දීම සිදුකර ඇත.
<table>
<tr><th>ආයතනය</th><th>ශ්‍රී ලංකා නාවික හමුදා ජල පිරිපහදු මධ්‍යස්ථාන</th><th>ශ්‍රද්ධාරූප වාහිනියේ ජල පිරිපහදු මධ්‍යස්ථාන</th><th>වෙනත් ජල පිරිපහදු මධ්‍යස්ථාන</th></tr>
<tr><td>මධ්‍යස්ථාන සංඛ්‍යාව</td><td>313</td><td>84</td><td>20</td></tr>
<tr><td>භට සංඛ්‍යාව</td><td>405</td><td>136</td><td>32</td></tr>
</table>
</td>
<td></td>
<td>✓</td>
<td></td>
</tr>
</table>

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

- මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය අනුව, එකී කාර්යන් කිනම් තිරසර සංවර්ධන ඉලක්කයන් හා සැසඳෙන්නේ ද යන වග හඳුනා ගැනීම.

- එම කාර්යන්, අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හා තවදුරටත් සෘජුව සහසම්බන්ධ කර ඊට තිරසර සංවර්ධන ඉලක්ක මුලික කර ගත් නව මුහුණුවරක් ලබා දීම.

- හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු අංශ වෙත ලබා දුන් උපදෙස් ප්‍රකාරව සැලසුම් සකස් කිරීම, එම සැලසුම් වාර්ෂිකව සැලසුම් වාර්තාවට ඇතුළත් කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කරවීම.

- ඉහත 5.1 ඡේදයෙහි හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු අතුරින් මෙම දෙපාර්තමේන්තුවේ සෘජු රාජකාරී වපසරිය තුළ නීතිය හා සාමය සුරැකීම, දිළිඳු බව පිටුදැකීම වැනි අරමුණු කිහිපයක් 75% ක පමණ ප්‍රතිශතයකින් ඉටු කිරීමට හැකි වීම.

5.2.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

- මෙම දෙපාර්තමේන්තුව විශාල ශ්‍රම බලකයකින් සමන්විත දෙපාර්තමේන්තුවකි. එම ශ්‍රම බලකායට විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සරිලන හා විධිමත් ලෙස පවරාගත හැකි ඉඩම් නොමැතිකම එක් අභියෝගයකි.

- එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරගෙන යාමේදී හදිසි සම්පත් ඌනතාවන් ඇති වීම සහ අනපේක්ෂිත ව්‍යවසනවලින් ඇති වන බලපෑම් තවත් එක් අභියෝගයකි.

- තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක වීම සඳහා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර ප්‍රකාශනයන්හි සිට සියලුම ආයතනික පරිපාටින්, සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කළ යුතුව ඇති බැවින්, ඒ සඳහා අනුගතවීමට යම් කාලයක් වැය වීම.


- මෙම සංකල්පය මෑතක සිට හඳුන්වාදුන් නව වැඩපිළිවෙලක් බැවින් පුර්ව අත්දැකීම්, දැනුම සහ යටිතල පහසුකම් සපයා ගැනීමට හැකි වන සේ මෙම සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක වන ආයතනික පුර්වදර්ශයන්හි හිඟතාව.


- තිරසර සංවර්ධන ජාතික වැඩපිළිවෙල තුළ එක් එක් ආයතනය වෙත පැවරෙන ඉලක්ක කවරේද යන්න, එම ඉලක්ක අන්තර් සම්බන්ධීකරණයට හා ඉටු කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජාතික මට්ටමින් පුළුල් සංවිධනාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක නොවීම මත එක් එක් ආයතන මෙම වැඩසටහන තුළ හුදකලා වීම.

6 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)*
ජ්‍යෙෂ්ඨ	23	18	5
තෘතීයික	84	67	17
ද්විතීක	126	66	60
ප්‍රාථමික	39,960	31,917	8,043
එකතුව	40,193	32,068	8,125





6.2 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
විනයාරක්ෂක පාඨමාලාව	68	2024.01.03 සිට 2024.01.12	175,725.00	-	දේශීය	පුහුණුව හා හැකියාව වර්ධනය
මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශක පාඨමාලාව)	73	2024.02.26 සිට 2024.02.29	225,000.00	-	එම	එම
ආපදා කළමණාකරන පාඨමාලාව	43	2024.02.27 සිට 2024.02.29	54,000.00	-	එම	එම
පෙදරේරු පාඨමාලාව	32	2024.03.04 සිට 2024.03.10	90,000.00	-	එම	එම
ජලනල කාර්මික පාඨමාලාව	36	2024.03.21 සිට 2024.03.27	43,000.00	-	එම	එම
වඩු කාර්මික පාඨමාලාව	35	2023.09.01 සිට 2023.09.07 දක්වා හා 2023.12.04 සිට 2023.12.10 දක්වා	579,735.00	-	එම	එම
බියුගල් පාඨමාලාව	17	2024.03.11 සිට 2024.03.24	5,360.00	-	එම	එම
විදුලි කාර්මික පාඨමාලාව	25	2024.03.25 සිට 2024.03.31	456,000.00	-	එම	එම
මානව සම්පත් කළමණාකරන පාඨමාලාව	90	2024.03.26 සිට 2024.03.28	140,000.00	-	එම	එම
රියදුරු කාර්මික පාඨමාලාව	32	2024.03.21 සිට 2024.03.31	544,863.00	-	එම	එම
ගිණි නිවීමේ වැඩමුළුව	22	2024.05.02 සිට 2024.05.04	13,500.00	-	එම	එම
නියාමක/ උප නියාමක සංස්කරණ පාඨමාලාව	211	2024.05.06 සිට 2024.05.19	නැත	-	එම	එම
ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව	19	2024.06.25 සිට 2024.06.28	නැත	-	එම	එම
විනයාරක්ෂක පාඨමාලාව	66	2024.06.03 සිට 2024.06.18	106,500.00	-	එම	එම
බලකා විනය පාලක පාඨමාලාව	29	2024.07.01 සිට 2024.07.15	-	එම	එම	එම

ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව	7	2024.07.03 සිට 2024.07.06	-	එම	එම	-
පෙදරේරු පාඨමාලාව	21	2024.07.08 සිට 2024.07.14	-	එම	එම	එම
වඩු කාර්මික පාඨමාලාව	27	2024.07.19 සිට 2024.07.25	-	එම	එම	එම
ජලනල කාර්මික පාඨමාලාව	26	2024.07.28 සිට 2024.08.04	-	එම	එම	එම
විගණණ හා ගිණුම් මූල්‍ය පාඨමාලාව	123	2024.07.29 සිට 2024.07.30	-	එම	එම	එම
විදුලි කාර්මික පාඨමාලාව	28	2024.08.08 සිට 2024.08.14	-	එම	එම	එම
ගිණි නිවීමේ වැඩමුළුව	33	2024.08.14 සිට 2024.08.15	-	එම	එම	එම
රියදුරු පාඨමාලාව	25	2024.08.26 සිට 2024.09.02	-	එම	එම	එම
කාර්යාල කළමණාකරන පාඨමාලාව	69	2024.08.28	-	එම	එම	එම
ප්‍රසම්පාදන ක්‍රියාවලලිය	40	2024.09.03	-	එම	එම	එම
කාර්යාල කළමණාකරණ පාඨමාලාව	53	2024.09.10 සිට 2024.09.11	-	එම	එම	එම
පෙදරේරු පාඨමාලාව	18	2024.09.06 සිට 2024.09.13	-	එම	එම	එම
සිඅා/උනි/නි/ සංස'කරණ පාඨමාලාව	173	2024.10.01 සිට 204.10.14	-	එම	එම	එම
ගබඩා පාලක පාඨමාලාව	63	2024.12.09 සිට 2024.12.20	-	එම	එම	එම
ඇගලුම් පුහුණුව	74	2024.12.12	-	එම	එම	එම
බටහිර නර්ථන පුහුණුව	19	2024.12.02 සිට 2024.12.13	-	එම	එම	එම

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුවට නව බඳවාගැනීම් සිදු නොකරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී ඇත. ඒ අනුව දැනට මෙම දෙපාර්තමේන්තුව වර්ෂ 10 කට ආසන්න කාලයක් තිස්සේ නිලධාරීන් විශ්‍රාම යෑම, මියයෑම, ඉල්ලා අස්වීම්, සේවයෙන් පහකිරීම් යනාදී වශයෙන් කාර්ය මණ්ඩලයේ සිදු වන අඩු වීම් ප්‍රතිපූර්ණය නොවන ක්ෂය වන දෙපාර්තමේන්තුවක් බවට පත් කර ඇත.

ඒ අනුව තාක්ෂණික, සෞන්දර්ය, ක්‍රීඩා, පරිගණක, කාර්මික වැනි විෂයන් තුළ හටයන් කැපවීමෙන් හා දැඩි පුහුණුවෙන් අත්පත් කරගත් දෙපාර්තමේන්තු කිර්තිනාමය හා ප්‍රමිතිය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑමට බාධාවන් මතු වී ඇත. විශ්‍රාම යාම, මියයෑම වැනි හේතූන් නිසා නිපුණැති නිලධාරීන්ගේ දැනුම අහිමි වීමත්, එම හිඟයට අලුතින් බඳවාගැනීම් සිදු කළ නොහැකි වීමත් ඊට හේතුවයි.

අවම වශයෙන් උක්ත දක්වා ඇති විෂයන් සඳහා සීමාවන්ට යටත්ව හෝ නවක නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට කර ඇති ඉල්ලීම් සඳහා අනුමැතිය ලැබෙන්නේ නම්, එකී කාර්යසාධන රික්තය සාධනීය ලෙස අවම කර ගත හැකි වනු ඇත.

දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය තුළ, උක්ත කි පුරප්පාඩු සම්පූර්ණ කිරීම ඉතා අත්‍යවශ්‍ය හා කඩිනම් අවධානය යොමුවිය යුතු කාරණාවක් බව වැඩිදුරටත් පෙන්වා දෙමු.

*** ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න**

පැහැදිලි කරන්න

- මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ වූයේ යුද සමයේ තර්ජිත ගම්මාන ආරක්ෂා කර ගනිමින් රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමයි. ඒ අනුව කාලීන අවශ්‍යතාව මත අධ්‍යාපන, වෘත්තීය හෝ වෙනත් සුදුසුකම් ඇගයීමකින් තොරව අදාළ ප්‍රදේශයන්හි පදිංචි පුද්ගලයන් යන පදනමින් පමණක් ඔවුහු සේවයට බඳවා ගෙන ඇත. එසේ හෙයින් ඔවුන් අනෙකුත් සන්නද්ධ හමුදා හා පොලිස් සාමාජිකයන්ට සාපේක්ෂව වෘත්තීය හා තාක්ෂණික දැනුමින් අඩු ධාරිතාවක පිරිසක් විය. එසේ නමුත්, යුද විජයග්‍රහණයෙන් පසු විධිමත් විෂය නිර්දේශයක් හා කාල සටහනක් යටතේ දෙපාර්තමේන්තු පුහුණු පාසල් තුළින් ඔවුන් වෙත මූලික හා නායකත්ව පුහුණු ලබා දෙන ලදී. එමගින් ඔවුන් අනෙකුත් හමුදාවන්ට සමාන ආචාරශීලී, විනයගරුක හා වෘත්තීය හමුදාවක් බවට පරිවර්තනය කර ගැනීමට හැකි විය. තවද හමුදා සංග්‍රාම, සරඹ, තූර්ය වාදන, සෞන්දර්ය, තාක්ෂණ වැනි විෂයන්හි වර්තමාන අවශ්‍යතාවන්ට අනුකූලව ඔවුන්ට ලබාදෙනු ලබන පුහුණුව තුළින් හමුදාවක් ලෙස ඔවුන්ගේ ධාරිතා වර්ධනය අපේක්ෂා කෙරේ.

- දෙපාර්තමේන්තුවට අනුමත උසස් කිරීමේ පරිපාටිය අනුව, සේවයේ ස්ථීර වීමට හා ඉදිරි උසස් වීම් සඳහා සුදුසුකම් ලැබීමට මූලික හා නායකත්ව පුහුණු සපුරා තිබීම අනිවාර්ය වේ.

- බාහිර වෘත්තීය පුහුණු ආයතන වෙතින් විවිධ වෘත්තීය පුහුණු ලබා දීම තුළින් සිවිල් ආරක්ෂක සාමාජිකයන් සේවයෙන් විශ්‍රාම ලැබූ පසු වුව ද තම දැනුම හා පරිචය භාවිතයෙන් විවිධ කර්මාන්තයන්හි ස්වයං රැකියාවක නියැලීමෙන් අතිරේක අදායමක් ලැබිය හැකි වනු ඇත.

- ඊට අමතරව, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව මණ්ඩලය වැනි විවිධ බාහිර ආයතන වෙතින් හා සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සම්පත් දායකයන් වෙතින් ඔවුන් වෙත ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සංග්‍රහය, ප්‍රසම්පාදන සංග්‍රහය, රජයේ ආයතනික ගිණුම්කරණය, වැටුප් සැකසීම, විගණනය, කාර්යාලයීය කාර්ය පරිපාටි, දෙවන භාෂා පාඨමාලා යනාදී වශයෙන් විවිධ පුහුණු ලබා දීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

7 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.6	වෙනත්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	මෙය භාවිතා කිරීමක් සිදු නොවේ.	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම.	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.	-	-
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.	-	-

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ.	ගර්හිත වන වාහන අපහරණය කිරීම සඳහා අවැසි ඉදිරි කටයුතු ඉතා වේගවත්ව සිදුකල ද ක්‍රියා පටිපාටියෙහි පවතින දුර්වලතා මත යම් යම් ස්ථාන තුල කාර්ය ප්‍රමාද වනු දැකිය හැක.	අපහරණ ක්‍රියා පටිපාටියෙහි පවතින දුර්වලතා හඳුනාගෙන ඊට පිළියම් යෙදීම තුල මෙම තත්ත්වය මග හරවා ගත හැක.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	-	අනුකූල නොවේ	කල්බදු ගෙවනු ලබන වාහන මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැත.

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	නිරවුල් කරමින් පවති	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	වර්ෂය අවසාන වීමට පෙර පියවා ඇත	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			

17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.	-	-

අවසානය.

කාර්යසාධන වාර්තාව - 2024		
අනුමැතිය		
මේජර් ජෙනරල් කේඑච්පීපී ප්‍රනාන්දු (විශ්‍රාමික)	අධ්‍යක්ෂ ජනරාල්	
සංස්කරණ හා ප්‍රතිශෝධන කමිටු සාමාජිකයින්		
කර්නල් ජේකේ දිසානායක	අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	සභාපති
ලුතිනන් කර්නල් එම්ඒසීපී මාරසිංහ	සහකාර අධ්‍යක්ෂ (පාලන)	සාමාජික
ලුතිනන් කර්නල් එම්.ඒ.චමින්ද ගුණරත්න	නියෝජ්‍ය අධ්‍යකෂ (පිරිස් පාලන)	සාමාජික
ලුතිනන් කමාන්ඩර් අජිත් නාරංගොඩ	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ)	සාමාජික
වී.ආර් සම්පත් මහතා	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)	සාමාජික
අධීක්ෂණය හා මෙහෙයවීම		
මේජර් ජනරාල් කේආර්කේකේටී බණ්ඩාර (විශ්‍රා)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	
කර්නල් යූවිඩබ්එස් අමරසිරි	අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)	
කෙටුම්පත්කරණය, සැකසුම හා පරිගණක යතුරු ලියනය		
ආර්කේකේ රත්නදේවී	කාන්තා උප නියාමක	